# වාර්ෂික වාර්තාව - 2017

## ජාතික පර්යේෂණ සභාව

ජාතික පර්යේෂණ සභාව
120/7, විද්‍යා මාවත, කොළඹ 07
දුරකථන අංකය: 011-2675176   ෆැක්ස්: 011-2675136
ඊ-මේල්: admin@nrc.gov.lk   වෙබ්: www.nrc.gov.lk

# පටුන

පටුන 1
දැක්ම සහ මෙහෙවර 2
අරමුණු 3
කාර්යයන් 4
කවුන්සිලය 5
කාර්ය මණ්ඩලය 6
සභාපතිතුමන්ගේ පණිවුඩය 7
විධායක ලේකම් වාර්තාව 8
පසුගිය වර්ෂ තුනට අදාළ මූලා සුවිශේෂීතාවයන් 10
ජාතික පර්යේෂණ සභාවේ වැඩසටහන් 12
විශේෂ අවස්ථා 15
ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන 15
අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන 21
විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය 25
රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා වැඩසටහන 27
වෙනත් වැඩසටහන් 29
වාර්ෂික ගිණුම් - 2017 33
විගණකාධිපතිගේ වාර්තාව 34
සම්බන්ධවිය හැකි අයුරු පිළිබඳ තොරතුරු 35

# දැක්ම සහ මෙහෙවර

**දැක්ම**

"දැනුම හා විද්‍යාව පදනම් කරගත්
සංවර්ධිත රටක තත්ත්වයට
ශ්‍රී ලංකාව පත් කිරීම."

**මෙහෙවර**

"මූලික හා ප්‍රායෝගික පර්යේෂණ ප්‍රවර්ධනය,
මූල්‍යනය හා පහසුකම් සැපයීම සහ අධීක්ෂණය සහ
ශ්‍රී ලංකාවේ මානව සම්පත් වර්ධනය තුළින්
දැනුම හා විද්‍යාව පදනම් කරගත්
සංවර්ධිත රටක තත්ත්වයට ශ්‍රී ලංකාව පත්කිරීම. "

# අරමුණු

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ 2016 අංක 11 දරණ පනත හා අනුකූලව, ජාතික පර්යේෂණ සභාවේ අරමුණු පහත පරිදි වේ;

- ❖ රට තුළ ක්‍රියාකාරී විද්‍යාත්මක සහ තාක්ෂණික ප්‍රජාවක් ගොඩනැංවීම අරමුණු කරගනිමින් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදුකිරීම පිණිස පහසුකම් සපයාදීම සඳහා රජයට සහාය ලබාදීම;
- ❖ ජාතික අවශ්‍යතාවන් සඳහා දායකත්වය සපයන පර්යේෂණ පදනමක් සංවර්ධනය කිරීම පිණිස උසස් අධ්‍යාපන ආයතනයන්හී, රාජ්‍ය අංශයේ පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හී සහ වෙනත් රාජ්‍ය ආයතනයන්හී විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළව සිදුකෙරෙන පර්යේෂණ ප්‍රවර්ධනය සහ ඒ සඳහා පහසුකම් සැලසීම;
- ❖ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළ පර්යේෂණ වැඩිදියුණු කිරීම සඳහා පෞද්ගලික අංශයේ සහයෝගීතාවය අපේක්ෂා කිරීම;

# කාර්යයන්

- සභාවේ අරමුණු ළඟා කරගනු වස් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළ පර්යේෂණයන් සිදුකිරීම සඳහා ප්‍රතිපාදන සපයාදීම;
- පර්යේෂණ සඳහා රජය විසින් සිදුකරනු ලබන ආයෝජනයන් ඵලදායී ලෙස භාවිතා කිරීම සහතික කරනු පිණිස, උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතන සහ වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදී ඇති ප්‍රතිපාදන හා සම්බන්ධිත විද්‍යා හා තාක්ෂණික පර්යේෂණ සඳහා පහසුකම් ලබාදීම, සම්බන්ධීකරණය, අධීක්ෂණය හා සුපරීක්ෂණය සිදුකිරීම;
- සභාවෙහි කාර්යයන් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ආනයනය කිරීම සහ පිළිගත් දේශීය හෝ විදේශීය ප්‍රභවයන් වෙතින් උපකරණ, අරමුදල් සහ අනෙකුත් සහායයන් ලබාගැනීම;
- විද්‍යාව හා තාක්ෂණය සහ අදාළ විෂයයන් පිළිබඳව සිදුකෙරෙන පර්යේෂණයන්හී වාර්තා, වාර සඟරා සහ පත්‍රිකා ඒකරාශී කිරීම, මුද්‍රණය සහ ප්‍රකාශයට පත්කිරීම;
- දේශීය හෝ විදේශීය විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හී සිදුකෙරෙන විද්‍යාත්මක අධ්‍යයනයන් හෝ විද්‍යාත්මක කාර්යයන් සඳහා ශිෂ්‍යත්ව සහ අධිශිෂ්‍යත්ව පිරිනැමීම;
- විද්‍යාව හා තාක්ෂණය සහ අදාළව සිදුකෙරෙන පර්යේෂණ හා නවෝත්පාදන පිළිගැනීමට ලක්කිරීමේ සහ ඒවාට සම්මාන ප්‍රදානය කිරීමේ ජාතික පද්ධතියක් වැඩිදියුණුකිරීම; සහ
- විද්‍යාව හා තාක්ෂණය සහ අදාළ විෂයයන් ආශ්‍රිතව සිදුකෙරෙන පර්යේෂණ පිළිබඳ දේශන, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම.

# කවුන්සිලය

**සභාපති**

1. මහාචාර්ය හිතනාදුර ජනක ද සිල්වා

**අනෙකුත් සාමාජිකයින්**

2. මහාචාර්ය උපාලි අමරසිංහ
3. මහාචාර්ය වීරතුංග ආරච්චිගේ ජනේන්ද්‍ර මාතලී ද කොස්තා
4. මහාචාර්ය විරංජිත් ප්‍රියාන් සොලමන් ඩයස්
5. මහාචාර්ය ලක්ෂමන් දිසානායක
6. මහාචාර්ය වේරංජ කරුණාරත්න
7. මහාචාර්ය කාමිනී නිර්මලා මෙන්ඩිස්
8. ඉංජිනේරු මොක්සෙවි ප්‍රේලිස්
9. ආචාර්ය ගල්බඩ ආරච්චිගේ සිරිමල් ප්‍රේමකුමාර
10. මහාචාර්ය අරුණී තිලකරත්න

**විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ නියෝජිත**

11. හිමාලි අතාවුදගේ මිය

**භාණ්ඩාගාර නියෝජිත**

12. ඊ.ඒ. රත්නසීල මයා

# කාර්ය මණ්ඩලය

2017.12.31 දිනට

| | |
|---|---|
| විධායක ලේකම් | එම්.සී. රාජපක්ෂ |
| ගණකාධිකාරී | එන්.එස්. හේවාගම |
| | |
| විද්‍යාත්මක නිලධාරී: | පී.කේ.ඒ.එස්.ආර්. නෝනිස් |
| විද්‍යාත්මක නිලධාරී: | එන්.කේ. දිසානායක |
| විද්‍යාත්මක නිලධාරී: | ඩබ්.කේ.එන්. හංසනා |
| විද්‍යාත්මක නිලධාරී: | එස්.එස්. කටුගම්පල |
| | |
| ගිණුම් නිලධාරී: | ඒ.කේ.ඩී.එම්. පෙරේරා |
| | |
| ගිණුම් සහකාර: | ඒ.ඊ.කේ. දයාරත්න |
| වැඩසටහන් සහකාර: | එම්.ඩබ්.සී. මධුමානි |
| වැඩසටහන් සහකාර: | එස්.එච්.එස්. ප්‍රියංකර |
| වැඩසටහන් සහකාර: | එම්.ඩී.ටී. මධුශානි |
| රියදුරු: | කේ.කේ.ටී. සඳරුවන් |
| රියදුරු: | එච්.එම්.එස්. ප්‍රේමකුමාර |

# සභාපතිතුමන්ගේ පණිවුඩය

ජාතික පර්යේෂණ සභාවේ 2017 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව, පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. ජාතික පර්යේෂණ සභාවේ ප්‍රධාන කාර්යභාරය වනුයේ පර්යේෂණ යෝජනාවන් කැඳවීම, ඒවා ඇගැයීමට ලක්කිරීම සහ ඒ සඳහා මූල්‍යාධාර ලබාදීම සහ ශ්‍රී ලාංකික විද්‍යාඥයින්ගේ සාර්ථක පර්යේෂණ හා නවෝත්පාදනයන් ජාතික වශයෙන් පිළිගැනීමට ලක්කිරීමයි.

2016 වසරේදී, පාර්ලිමේන්තු පනතක් මඟින්, ජාතික පර්යේෂණ සභාව ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ස්ථාපනය කරනු ලැබූ අතර, දැනට ජාතික පර්යේෂණ සභාවේ සේවක සංඛ්‍යාව එහි ස්ථිර කාර්ය මණ්ඩලයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා පියවර ගනු ලැබේ. පෞද්ගලික-රාජ්‍ය සහයෝගීතා වැඩසටහන සඳහා මූල්‍යාධාර ලබාදීම අප විසින් අඛණ්ඩව සිදුකරනු ලැබූ කාර්යයක් වූ අතර ඒ යටතේ නව ව්‍යාපෘති දෙකක් සඳහා 2017 වසරේදී මූල්‍යාධාර ලබාදීම සිදුකරනු ලැබිණි. තවද, ජාතික පර්යේෂණ සභාව විසින් නවෝත්පාදක පර්යේෂණ ව්‍යාපෘති සඳහා අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන 32ක්ද පිරිනමනු ලැබිණි.

විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන උළෙල මෙම වසරේ නොවැම්බර් මසදී පවත්වන ලදී. මෙම සම්මාන ප්‍රදානෝත්සවය අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු අතර ගරු විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමන්ගේ ගෞරවනීය සහභාගීත්වයද ඒ සඳහා හිමිවිණි. 2015 වසරේදී පළකරනු ලැබූ විද්‍යාත්මක ප්‍රකාශනයන් වෙනුවෙන් විද්‍යාඥයින් 295දෙනෙකුට මෙහිදී සම්මාන පිරිනමන ලදී. මෙයට අමතරව තරුණ විද්‍යාඥයින් දිරිගැන්වීමේ ප්‍රධාන අරමුණ ඇතිව දෙවන මට්ටමේ සම්මානයන් ලෙස "විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජාතික පර්යේෂණ සභා කුසලතා සම්මාන" විද්‍යාඥයින් 503දෙනෙකු සඳහා ප්‍රදානය කෙරිණි.

ගරු විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමන්ට, රාජ්‍ය අමාත්‍යතුමන්ට සහ අමාත්‍යාංශ ලේකම්තුමියට, ඔවුන් විසින් නිබඳව ලබාදුන් සහායය සහ දිරිගැන්වීම වෙනුවෙන්, ජාතික පර්යේෂණ සභාවේ ස්තුතිය පිරිනැමීමට කැමැත්තෙමි.

විද්‍යාජ්‍යෝති මහාචාර්ය එච්. ජනක ද සිල්වා
සභාපති

# විධායක ලේකම් වාර්තාව

2017 ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව සඳහා පණිවුඩයක් එක්කිරීමට මා ලද මෙම අවස්ථාව මාගේ ඉමහත් ප්‍රීතියට හේතු වන අතර ඒ හරහා මෙම වසර තුළ ජාතික පර්යේෂණ සභාවේ ක්‍රියාකාරකම් පිළිබඳ දැනුමක් ඔබ වෙත මේ තුළින් ලැබේ යැයි අපේක්ෂා කරමි. මෙම වසර තුළ සිදුකරනු ලැබූ කාර්යයන් පිළිබඳ වාර්තා කිරීමේදී මෙන්ම ඒ පිළිබඳ වාර්තාවක් සැපයීමේදී වාර්ෂික වාර්තා සඳහා වැදගත් ස්ථානයක් හිමිවේ.

2016 අංක 11 දරණ පනත හා අනුකූලව ජාතික පර්යේෂණ සභාවේ ප්‍රධාන අරමුණු වනුයේ, රට තුළ ක්‍රියාකාරී විද්‍යාත්මක සහ තාක්ෂණික ප්‍රජාවක් ගොඩනැංවීම අරමුණු කර ගනිමින් විද්‍යා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදුකිරීම පිණිස පහසුකම් සපයාදීම සඳහා රජයට සහාය ලබාදීම, ජාතික අවශ්‍යතාවන් සඳහා දායකත්වය සපයන පර්යේෂණ පදනමක් සංවර්ධනය කිරීම පිණිස උසස් අධ්‍යාපන ආයතනයන්හී, රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතනයන්හී සහ වෙනත් රාජ්‍ය ආයතනයන්හී විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළව සිදුකෙරෙන පර්යේෂණ ප්‍රවර්ධනය, ඒ සඳහා පහසුකම් සැලසීම සහ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළ පර්යේෂණයන් වැඩිදියුණු කිරීම සඳහා පෞද්ගලික අංශයේ සහයෝගීතාවය අපේක්ෂා කිරීමයි.

ජාතික පර්යේෂණ සභාවේ ප්‍රධාන කාර්යභාරය වනුයේ, විද්‍යාත්මක පර්යේෂණ සහ සංවර්ධන (R&D) ආයතනයන් සහ උසස් අධ්‍යාපන ආයතනයන්හී පර්යේෂකයින්හට පර්යේෂණ සිදුකිරීම සඳහා ප්‍රදානයන් පිරිනැමීමත්, විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා සම්බන්ධිත පර්යේෂණ හා නවෝත්පාදනයන් පිළිගැනීමට ලක්කිරීම සහ සම්මාන ප්‍රදානය කිරීම සඳහා ජාතික පද්ධතියක් සංවර්ධනය කිරීමත්ය.

මෙම වැදගත් අභිමතාර්ථ සැබෑකර ගනු වස්, 2017 වර්ෂය තුළදී ජාතික පර්යේෂණ සභාව විසින් පහත වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබිණි; අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන, රාජ්‍ය-පෞද්ගලික දෙඅංශයේ සහයෝගීතා වැඩසටහන, ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන, විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන, සමාජ සුභසාධන සහ මහජන දැනුවත් කිරීමේ වැඩසටහන.

1999 වර්ෂයේදී ආරම්භ කරනු ලැබූ අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන යනු, අවම පරිපාලන පටිපාටීන් යටතේ පර්යේෂණ සිදුකිරීම සඳහා විද්‍යාඥයින් වෙත තරඟකාරී පදනම මත පහසුකම් සපයාදෙනු ලබන ප්‍රතිපාදන යෝජනා ක්‍රමයකි. 2017 මූල්‍ය වර්ෂය තුළදී අයදුම්පත් 105ක් ලද අතර පශ්චාත් උපාධි අධිශිෂ්‍යත්ව 27ක් ප්‍රදානය කරමින් ඉන් අයදුම්පත් 32ක් මූල්‍යයනය කරනු ලැබිණි. මෙම වර්ෂය තුළදී ප්‍රදානයන් 150කට අධික සංඛ්‍යාවක් ක්‍රියාත්මකව පැවතිණි. ප්‍රදානයන් 17ක් සම්බන්ධව අවසාන ඇගැයීම් ක්‍රියාවලිය සම්පූර්ණ කරනු ලැබ ඇති අතර SCIE ප්‍රකාශන 23ක් සහ පශ්චාත් උපාධි අපේක්ෂකයින් 15දෙනෙකු විසින් සිය උපාධීන් ලබාගැනීම (ආචාර්ය උපාධීන් 07ක් සහ දර්ශනපති උපාධි 08ක්) සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ 73කදී පර්යේෂණ සොයාගැනීම් බෙදාහැරීම යනාදිය මේ යටතේ ප්‍රතිඵල විණි.

2012 වර්ෂයේදී ආරම්භ කරනු ලැබූ රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා වැඩසටහන හරහා රජයේ පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හී සහ විශ්වවිද්‍යාලයන්හී විද්‍යාඥයින් සහ පෞද්ගලික අංශය අතර සහයෝගීතාවයන් ස්ථාපනය කරගැනීම සඳහා පහසුකම් සලසා දේ. මෙම ව්‍යාපෘතීන් මඟින්, පර්යේෂණයන් සිදුකළ යුතු පර්යේෂණ ක්ෂේත්‍රයන් සහ ඒවායේ වාණිජමය විභවතාවය පැහැදිළි ලෙස හඳුනාගනී. මෙම වර්ෂය තුළදී ව්‍යාපෘතීන් 02ක ක්‍රියාකාරකම් සම්පූර්ණ කරනු ලැබිණි. වර්ෂය තුළදී නව අයදුම්පත් කැඳවනු ලැබූ අතර ලද අයදුම්පත් 10ක් ඇගැයීමට ලක්කොට ඒ අතුරින්

මූලාධාර සැපයීම සඳහා 02ක් තෝරාගනු ලැබිණි. ඉන් 01ක් සඳහා ප්‍රදානයන් සිදුකෙරුණු අතර 2016 යෝජනා ක්‍රමයේ එක් ව්‍යාපෘතියක් සඳහා ද මෙම වසර තුළදී ප්‍රදානයක් සිදු කෙරිණි. රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා ව්‍යාපෘති 08ක් ක්‍රියාත්මකව පැවතිණි.

2013 වසරේදී, ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ වැඩසටහන (TO) ආරම්භ කරනු ලැබූ අතර උග්‍ර ජාතික ගැටළු සඳහා පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම හරහා දිගුකාලීන විසඳුම් සොයා ගැනීම මෙමඟින් අපේක්ෂා කෙරේ. ජල පවිත්‍රීකරණය සඳහා උසස් ද්‍රව්‍ය අශ්‍රිතව සකස්කරනු ලබන ජල පෙරනයක් වැඩිදියුණු කිරීම පිළිබඳ, 2016 වර්ෂයේදී තෝරාගනු ලැබූ එක් යෝජනාවක් සඳහා ප්‍රදානයන් සිදුකෙරිණි. ක්‍රියාත්මකව පවතින ව්‍යාපෘති 05 පිළිබඳව ඇගැයීම සහ සුපරීක්ෂණය සඳහා වර්ෂය තුළදී ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්විණි.

2018 වසර සඳහා මෙම ප්‍රදාන යොජනා ක්‍රම ත්‍රිත්වය යටතේ අයැදුම්පත් කැඳවීම, 2017 සැප්තැම්බර්/ ඔක්තෝම්බර් කාල සීමාවේදී සිදුකිරීමට පියවර ගැනීම නව මූලාරම්භයක් වූ අතර ඒ හරහා අයැදුම්පත් ඇගැයීමට වැඩි කාලයක්ද, වසර ආරම්භයේදී ප්‍රදානයන් පිරිනැමීමේ හැකියාවද ලැබෙනු ඇත.

විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන ප්‍රදාන (PASP) ක්‍රමවේදය සම්පාදනය කොට ඇත්තේ, පර්යේෂණ අංශයෙන් ජාත්‍යන්තර තත්ත්වයන් කරා ළඟා වී ඇති විද්‍යාඥයින් නිසි ඇගැයීමට ලක්කිරීමේ මුඛ්‍ය අරමුණ පෙරදැරි කර ගනිමිනි. විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන යනු, ජාතික පර්යේෂණ සභා දින දර්ශනයේ වාර්ෂිකව පවත්වනු ලබන අංගයකි. මෙම උළෙල, නොවැම්බර් මස යෙදෙන විද්‍යා දිනය හා සමගාමීව නොවැම්බර් මසදී පවත්වනු ලැබේ. 2015 වර්ෂයේ ප්‍රකාශිත විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානෝත්සවය 2017 නොවැම්බර් මස 06 වන දින, අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මෙහිදී විද්‍යාඥයින් 295දෙනෙකු සඳහා උපහාර පිරිනැමිණි.

2017 වසර තුළ සමාජ සුභසාධන වැඩසටහන යටතේ උතුරු මැද පළාතේ 800කට ආසන්න පාසැල් සංඛ්‍යාවක් සඳහා ''පොලිතීන්හි තිරසර කළමනාකරණය'' පිළිබඳ වැඩසටහන් පවත්වන ලදී.

වැදගත් පර්යේෂණ සොයාගැනීම් පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීම සඳහා පුවත්පත් ලිපි 40කට වැඩි සංඛ්‍යාවක් ප්‍රකාශයට පත්කරන ලදී.

දැනුම වර්ධනය අරමුණු කරගත් සහ සමස්ත ප්‍රජාවට ප්‍රතිලාභ අත්කර දෙන අන්දමේ උසස් තත්ත්වයේ පර්යේෂණයන් සඳහා මූලාධාර ලබාදීමට ජාතික පර්යේෂණ සභාව පෙර පරිදිම කැපවී සිටී.

ජාතික පර්යේෂණ සභාවේ ප්‍රගමනය උදෙසා සිය වටිනා දායකත්වය ලබාදුන් සභාපතිතුමන් සහ කවුන්සිලයේ සාමාජිකයන් සඳහාත්, වර්ෂය මුළුල්ලේ අප වෙත ලබාදුන් සහාය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයේ සහ විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශ නිලධාරීන්ටත් මාගේ කෘතඥතාවය පිරිනැමීමට කැමැත්තෙමි. එමෙන්ම, වසර මුළුල්ලේ ලබාදුන් නොමඳ සහායය වෙනුවෙන් ජාතික පර්යේෂණ සභාවේ කාර්ය මණ්ඩලය වෙතද මාගේ ස්තූතිය හිමිවේ.

මනීෂා සී. රාජපක්ෂ
විධායක ලේකම්

# පසුගිය වර්ෂ තුනට අදාළ මූල්‍ය සුවිශේෂීතාවයන්

| වැඩසටහන් (ක්‍රමෝපායන්) | | භෞතික ප්‍රගතිය | | | මූල්‍යමය ප්‍රගතිය රු. මිලියන | | |
|---|---|---|---|---|---|---|---|
| | දර්ශකය | 2015 | 2016 | 2017 | 2015 | 2016 | 2017 |
| ජාතික පර්යේෂණ සභාවේ පොදු පරිපාලනය | | | | | 16.85 | 17.6 | 20.99 |
| පහත වැඩසටහන් සඳහා සංවර්ධන ආධාර | | | | | 268.52 | 230.00 | 178.63 |
| ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ වැඩසටහන (2014 වසරේදී ආරම්භ කරන ලදී.) | වැඩසටහන් සංඛ්‍යාව | | වැඩසටහන් 2ක් ආරම්භ කෙරිණි. | | | | |
| පෞද්ගලික රාජ්‍ය සහයෝගීතා වැඩසටහන (2013 වසරේදී ආරම්භ කරන ලදී.) | වැඩසටහන් සංඛ්‍යාව | වැඩසටහන් 1ක් ආරම්භ කෙරිණි. | වැඩසටහන් 3ක් ආරම්භ කෙරිණි.<br>නිෂ්පාදන 2ක් දියත් කෙරිණි. | වැඩසටහන් 2ක් ආරම්භ කෙරිණි. | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන වැඩසටහන (1999 වර්ෂයේදී ආරම්භ කෙරිණි.) | පිරිනමන ලද පර්යේෂණ ප්‍රදාන සංඛ්‍යාව<br><br>පිරිනමන ලද ආචාර්ය උපාධි/ දර්ශනපති උපාධි අධිශිෂ්‍යත්ව | අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන 61ක් පිරිනැමීම.<br><br>ආචාර්ය උපාධි/ දර්ශනපති උපාධි අධිශිෂ්‍යත්ව 46ක් පිරිනැමීම. | අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන 34ක් පිරිනැමීම.<br><br>ආචාර්ය උපාධි/ දර්ශනපති උපාධි අධිශිෂ්‍යත්ව 19ක් පිරිනැමීම. | අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන 32ක් පිරිනැමීම.<br><br>ආචාර්ය උපාධි/ දර්ශනපති උපාධි අධිශිෂ්‍යත්ව 27ක් පිරිනැමීම. | - | - | - |
| | | | | | | | |
| විද්‍යාත්මක ප්‍රකාශන වැඩසටහන සඳහා ජනාධිපති සම්මාන (PASP) (2001 වර්ෂයේදී ආරම්භ කෙරිණි.) | පවත්වනු ලැබූ උත්සව හා සම්මානලාභී විද්‍යාඥයින් සංඛ්‍යාව | 2013 වර්ෂය සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය කිරීමේ උළෙල පවත්වන ලද අතර විද්‍යාඥයින් 211 දෙනෙකු සඳහා සම්මාන ප්‍රදානය කෙරිණි. | 2014 වර්ෂය සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය කිරීමේ උළෙල පවත්වන ලද අතර විද්‍යාඥයින් 232 දෙනෙකු සඳහා සම්මාන ප්‍රදානය කෙරිණි. | 2015 වර්ෂය සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය කිරීමේ උළෙල පවත්වන ලද අතර විද්‍යාඥයින් 295දෙනෙකු සඳහා සම්මාන ප්‍රදානය කෙරිණි. | - | - | - |
| | | | | | | | |
| වෙනත් වැඩසටහන්: සමාජ සුභසාධන/ මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් | සම්පූර්ණ කරනු ලැබූ ක්‍රියාකාරකම් | සමාජ සුභසාධන වැඩසටහන් 4ක් පවත්වන ලදී.<br><br>ජාතික පර්යේෂණ සභාව විසින් පවත්වනු ලැබූ පර්යේෂණයන් පිළිබඳ පුවත්පත් ලිපි 11ක් ප්‍රකාශයට පත්කරනු ලැබිණි. | සමාජ සුභසාධන වැඩසටහන් 4ක් පවත්වන ලදී.<br><br>ජාතික පර්යේෂණ සභාව විසින් පවත්වනු ලැබූ පර්යේෂණයන් පිළිබඳ පුවත්පත් ලිපි 50ක් ප්‍රකාශයට පත්කරනු ලැබිණි. | සමාජ සුභසාධන වැඩසටහන් 6ක් පවත්වන ලදී.<br><br>ජාතික පර්යේෂණ සභාව විසින් පවත්වනු ලැබූ පර්යේෂණයන් පිළිබඳ පුවත්පත් ලිපි 40ක් ප්‍රකාශයට පත්කරනු ලැබිණි. | - | - | - |
| **එකතුව** | | | | | **285.37** | **247.60** | **199.62** |

# ජාතික පර්යේෂණ සභාවේ වැඩසටහන්

**ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන:**

ගැටලු පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම හෝ සංකීර්ණ ගැටලු විසඳාලීම සඳහා ඒකෙක පර්යේෂණ හරහා හැකියාව ලැබෙනුයේ අල්ප වශයෙනි. බහුවිෂයානුබද්ධ ප්‍රවේශයක් අනුගමනය කිරීමෙන් සාමාන්‍ය සීමාවන්ට පරිබාහිර ගැටලු නැවත අර්ථදැක්වීම සහ දුෂ්කර ගැටලු අලුතින් අවබෝධ කරගැනීම හරහා විසඳුම් වෙත එළැඹීමට හැකිවන පරිදි බහුවිධ විෂයයන් වෙතින් සුදුසු පරිදි දායකත්වයන් ලබා ගැනේ.

මෙම වැඩසටහන 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් යෝජිත පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම් ඉතා කඩිනමින් අවශ්‍ය වන, අතිශය වැදගත් අංශයන් 10ක් හා අනුගතව ක්‍රියාත්මක කෙරිණි.

රාජ්‍ය විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන ආයතන සහ විශ්වවිද්‍යාලයන්හී පර්යේෂක පිරිස් වෙතින් පූර්ව යෝජනා කැඳවන ලදී. ආර්ථික සංවර්ධනය, සමාජ සුභසාධනය සහ රටෙහි පාරිසරික තිරසරභාවය අරමුණු කරගනිමින්, ජාතික වශයෙන් අදාළත්වයක් සහිත ගැටලු විසඳාලීම මෙම ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ව්‍යාපෘති හරහා සිදුකිරීමට අපේක්ෂිතය.

ප්‍රතිපත්ති/ ක්‍රමෝපාය හෝ නිෂ්පාදන සංවර්ධනය සඳහා අවශ්‍ය දැනුමෙහි පවතින ප්‍රධාන පරතරයන් විසඳාලීම, දේශයෙහි ප්‍රගමනය සඳහා බාධක හෝ අභියෝග එල්ල කෙරෙන ගැටලු විසඳාලීම මෙම ව්‍යාපතීන්හී අරමුණු වේ. පර්යේෂණ ප්‍රතිඵල ප්‍රතිපත්ති, ක්‍රමෝපායයන්, නිෂ්පාදන/ ක්‍රියාවලි සංවර්ධනය කිරීම සහ ඒවා පිළිබඳ අවබෝධයක් ලබාගැනීම සඳහා වන ගමන් මඟ පැහැදිළිව හඳුනාගත යුතුය.

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ජාතික පර්යේෂණ හා සංවර්ධන ප්‍රතිපත්ති රාමුව (වැදගත් ක්ෂේත්‍ර 10) සමඟ අනුගත වෙමින් ප්‍රමුඛ ක්ෂේත්‍රයන් කිහිපයක් වෙතින් යෝජනා කැඳවනු ලැබිණි. එක් ප්‍රදානයක වටිනාකම මිලියන 50ක් වන අතර වසර 5ක කාලසීමාවක් සඳහා මෙම ප්‍රදානයන් සිදුකරයි. ජාතික පර්යේෂණ සභාව විසින් සැලකිය යුතු අන්දමේ මහජන මුදල් ප්‍රමාණයක් මෙම ව්‍යාපෘතීන් සඳහා ආයෝජනය කරන හෙයින්, මේ සඳහා මූල්‍යනය ඉතා ඉහළ තරඟකාරී පදනමකින් සිදුකෙරෙනු ඇත. වසර 5ක කාලයකට පසු සැලකියයුතු අන්දමේ ප්‍රතිඵලයක් ලබාදීමේ හැකියාවක් ඇති බවට ජාතික පර්යේෂණ සභාව විසින් සලකනු ලබන, ව්‍යාපෘතීන්හී කණ්ඩායමක් වශයෙන් එක්ව ක්‍රියා කළ හැකි කුසලතා සහිත, ඉතා සුදුසු පර්යේෂකයින් පමණක් තෝරාගැනීමට ජාතික පර්යේෂණ සභාව විසින් කටයුතු කෙරෙනු ඇත. පර්යේෂණයන්හී විවිධ අංශයන් පිළිබඳව කණ්ඩායමේ සාමාජිකයින් විසින් සමගාමී ලෙස කටයුතු කිරීමේ වාසිය මෙම බහුවිෂයයන් මත කේන්ද්‍රගත වූ ව්‍යාපෘති හරහා උදාවනු ඇත.

ප්‍රදානයෙහි මෙහෙයුම් බොහෝදුරට සමාන වනුයේ අන්වේෂක මත පදනම් වූ ප්‍රදානයන්ටය. කෙසේ වුවද, ප්‍රධාන අන්වේෂක තනතුරට අමතරව නියෝජ්‍ය අන්වේෂකයෙකුද පත්කෙරෙනු ඇත. මෙම ප්‍රදාන සිදුකිරීමෙන් අනතුරුව, ප්‍රකාශිත ප්‍රතිඵලයන් ළඟාකරගන්නා බවට සහතික කරනු වස් විධිමත් සහ දැඩි සන්නිරීක්ෂණයන්, සුපරීක්ෂණයන් සහ ඇගැයීම් යටතට මෙම ව්‍යාපෘතීන් පත්කෙරෙනු ඇත.

**අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදානවැඩසටහන:**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන සහ විශ්වවිද්‍යාල විසින් සිදු කෙරෙන පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ප්‍රධාන වශයෙන් මූල්‍යාධාර සැපයෙනුයේ රාජ්‍ය ආයතනික ප්‍රතිපාදන, තරඟකාරී ප්‍රදාන සහ පර්යේෂණ කොන්ත්‍රාත්තු වැනි විවිධ ප්‍රභවයන් වෙතිනි. ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන ආරම්භ කරනු ලැබූයේ විද්‍යාඥයින්හට අවම පරිපාලන අවහිරතා යටතේ සිය පර්යේෂණ කාර්යයන්හී නියැලීමට ඉඩ ප්‍රස්ථා ලබා දීමේ අරමුණෙනි.

ජාතික පර්යේෂණ සභාවෙහි පර්යේෂණ ප්‍රදාන වැඩසටහන හරහා රජයේ ආයතන සඳහා පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීම පිණිස තරඟකාරී ප්‍රදානයන් ලබා දීම සිදු කෙරේ. මෙම වැඩසටහන ක්‍රියාත්මක වූ කාලසීමාව තුල එය මනාව සංවිධිත කරනු ලැබිණි. මෙම ප්‍රදානයන් පිළිබඳව වාර්ෂිකව දැන්වීම් පළකෙරෙන අතර, විද්‍යාත්මක සංරචකය, ජාතික සංවර්ධනය සඳහා ඇති අදාලත්වය සහ ජාත්‍යන්තර සඟරාවන්හී මෙම සොයාගැනීම් පළවීම යන කරුණු මත ඇගයීම සිදු කෙරේ.

අයැදුම්පත් දැඩි ඇගයීමේ ක්‍රියාවලියකට ලක් කෙරේ. තෝරාගනු ලබන යෝජනාවන් සඳහා සුදුසු ප්‍රතිපාදන වෙන්කිරීම් පිළිබඳව සභාව විසින් තීරණය කෙරෙනු ඇති අතර මෙම ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයේ සිට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ තනි වගකීම දරණ ප්‍රධාන විමර්ශකයා වෙත සෘජුවම ලබාදේ. උපකරණ සහ පාරිභෝගික ද්‍රව්‍ය ආදිය සඳහා මෙම ප්‍රතිපාදන වෙන්කෙරේ. එක් එක් ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති බැංකු ගිණුමක් විවෘත කෙරෙන අතර ජාතික පර්යේෂණ සභාව විසින් සියළු ගණුදෙණු සුපරීක්ෂණය කෙරේ. පරිපාලන අවහිරතා අවම මට්ටමක තබා ගිනිමින් මෙම අරමුදල් ප්‍රයෝජනයට ගැනීම සඳහා සැලකිය යුතු අන්දමේ නම්‍යශීලීතාවයක් මේ හරහා විද්‍යාඥයින්ට ලැබේ. සුපරීක්ෂණය සහ ඇගැයීම, ජාතික පර්යේෂණ සභාවෙහි කමිටු මණ්ඩලය ප්‍රමුඛ කාර්යාලය මඟින් සිදු කෙරේ.

වත්මනදී ප්‍රදානය කෙරෙනු ලබන ප්‍රදානයන් ස්වභාවයෙන් විවිධාකාර වන බව මෙහිදී සඳහන් කළ යුතුය. මූලික විද්‍යාත්මක ප්‍රස්තුතයන්, ආහාර, ජලය, පරිසරය හා බලශක්ති යන ක්ෂේත්‍ර පිළිබඳව පර්යේෂණ මූල්‍යයනය කිරීමට අමතරව ජාතික පර්යේෂණ සභාව විසින් වාරිමාර්ග පද්ධතීන්, වනජීවී සහ පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය, කථන පරිවර්තනය, ඉදිකිරීම් සහ ගෘහ නිර්මාණ ශිල්පය, දුම්රිය ගමනාගමනය, ක්‍රීඩා සහ තවත් බොහෝමයක් ක්ෂේත්‍රයන්හී පර්යේෂණ ද මෑතක සිට මූල්‍යයනය කෙරේ.

සියලුම වැඩසටහන් සඳහා සරල සහ අංගසම්පූර්ණ අයදුම්පත්‍ර කට්ටලයක් පවතී. වසර තුළදී ජාතික පර්යේෂණ සභාව විසින් ලද අයදුම්පත්‍ර සංඛ්‍යාව ක්‍රමිකව වැඩිවීමක් පෙන්නුම් කර ඇති අතර මෙය ධනාත්මක සලකුණකි. මෙම වැඩසටහන හමුවේ ඇති අභියෝගය වනුයේ දැනටමත් ජාතික පර්යේෂණ සභාව විසින් අත් කරගනු ලැබ ඇති ගම්‍යතාවය එලෙසින් පවත්වාගෙන යාමයි

මෙම ප්‍රදානයන් වෙතින් උපරිම ප්‍රතිඵල ලබාගැනීමට හැකිවන අයුරින් මෙම ප්‍රදානයන්හි ප්‍රගතිය සුපරීක්ෂණය සහ ඇගැයීම සඳහා නව නීති රීති සහ මාර්ගෝපදේශනයන් විශාල සංඛ්‍යාවක් කමිටු මණ්ඩලය විසින් හඳුන්වා දෙනු ලැබිණි.

**<u>විද්‍යාත්මක ප්‍රකාශන වැඩසටහන සඳහා ජනාධිපති සම්මාන:</u>**

පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය කිරීමේ වැඩසටහන 2001 වසරේදී ආරම්භ කරනු ලැබූයේ ජාත්‍යන්තර තලය කරා ළඟාවූ විද්‍යාඥයින්ට බුහුමන් දැක්වීම, ජාතික විද්‍යාත්මක නිෂ්පාදනයන් ඉහළ නැංවීම සහ බුද්ධිගලනය වැළැක්වීම යන අභිමතාර්ථයන් පෙරදැරිවය. 1991 සිට මේ දක්වා විද්‍යාත්මක ප්‍රකාශන එළිදැක්වීම පිළිබඳ ජාතික සංඛ්‍යාලේඛන මඟින් පෙන්වා දෙන්නේ ගුණාත්මක විද්‍යාත්මක ප්‍රකාශනවල සංඛ්‍යාවේ ඉහළ නැඟීමේ ප්‍රවනතාවයෙහි මූලාරම්භය විය හැකිය.

මෙම සම්පූර්ණ ක්‍රමවේදය පදනම්වී ඇත්තේ ප්‍රසාරිත විද්‍යා සඳහන් දර්ශකය මතය (SCIE). SCIE යනු, විද්‍යාව මත ඇති කෙරෙන බලපෑම සහ උසස් තත්ත්වය හා අදාලව ලෝකයේ ඉහළම තත්ත්වයෙහි ලා සැලකෙන විද්‍යාත්මක සඟරාවන්හී දත්ත ගබඩාවයි. මෙලෙස SCIE විසින් වර්ෂයකදී සඟරා 14000ක් පමණ විශ්ලේෂණයට ලක් කෙරේ.

සමාජ විද්‍යාව හැරුණුකොට අනෙකුත් සියළුම "සංකීර්ණ විද්‍යා" තේමාවන් පර්යේෂණ සම්මාන ප්‍රදාන යෝජනා ක්‍රමය මඟින් ආවරණය කෙරෙන අතර ප්‍රසාරිත විද්‍යා සඳහන් දර්ශකයෙහි සලකා බැලෙන ප්‍රකාශන, ශ්‍රී ලාංකික කතුවරයෙකු දායක වූ ඒවා විය යුතුය.

2015 වසර තුළදී, එකී දර්ශකයෙහි ශ්‍රේණිගත සඟරාවන්හී පළවූ ප්‍රකාශනයන් සඳහා විද්‍යාඥයින් 295කට 2017 වසරේ පැවැත්වුණු උළෙළේදී සම්මාන පිරිනැමිණි.

**<u>රාජ්‍ය පෞද්ගලික සහයෝගීතා වැඩසටහන:</u>**

ශ්‍රී ලංකාවේ අපේක්ෂිත ආර්ථික සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේදී අත්‍යාවශ්‍ය කොටසක් වන, ගෝලීය වෙළඳපළ තුළ තරඟකාරීත්වයෙන් යුතු, අගය එකතු කළ නිෂ්පාදන හා සේවාවන් වැඩිදියුණු කිරීමට විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධනයන් මහත් සේ ඉවහල් වනු ඇත. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා, ශ්‍රී ලංකාව තුළ සිදු කෙරෙන පර්යේෂණ, ආර්ථිකයේ ප්‍රගමනයට ඉවහල් වන, ප්‍රධාන කර්මාන්තයන්හී අවශ්‍යතාවන් සපුරාලන ඉල්ලීම් මත පදනම් වූ පර්යේෂණ විය යුතුය.

රාජ්‍ය-පෞද්ගලික දෙඅංශයේ සහයෝගීතා (PPP) වැඩසටහන මඟින්, රටෙහි ආර්ථික සංවර්ධනය කෙරෙහි දායකත්වයක් ලැබෙන පරිදි පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සහ කර්මාන්තයන්හී ප්‍රධාන හවුල්කරුවන් සම්බන්ධ කිරීම සිදුකෙරේ. විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධනයන් ප්‍රවර්ධනය තුලින් අපනයන ආදායම් ඉහළ නැංවීම, අපනයන භාණ්ඩ විවිධාංගීකරණය සහ ආනයන ආදේශක ප්‍රවර්ධනය යනාදිය හරහා ආර්ථික සංවර්ධනය ළඟාකර ගැනීමේ හැකියාව පවතී. නව්‍ය හෝ වඩා හොඳ තත්ත්වයේ නිෂ්පාදන, ක්‍රියාවලි, සේවාවන්, අගය එකතුකිරීම්, වාණිජමය හැකියාවන් සහිත තාක්ෂණික ගැටළු විසඳීම යනාදිය කෙරෙහි යොමුවූ නවෝත්පාදක පර්යේෂණයන් මෙම වැඩසටහන සඳහා සලකා බැලෙනු ඇත. විවිධ අංශයන් අතර ඇති කරගනු ලබන සහයෝගීතාවයන් තුලින් කර්මාන්තමය පර්යේෂණ සහ සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා විසඳුම් සොයාගනු පිණිස අපගේ පර්යේෂණ විශේෂඥතාවය, වියදම්, සේවාවන් සහ පහසුකම් වඩා ඵලදායී අයුරින් බෙදාහදා ගැනීමට හැකියාව ලැබේ. මෙම සහයෝගීතාවයන් හරහා රාජ්‍ය අංශයේ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම්හි කාර්යක්ෂමතාවය වැඩිදියුණු කෙරෙනු ඇති අතර ඒ සඳහා ගතවන කාලයද අවම වනු ඇත. රාජ්‍ය අංශයේ සහයෝගීතාවය සහිත ව්‍යාපාරයක් මඟින් දරනු ලැබූ පර්යේෂණ හා සංවර්ධන වියදම්වලට අදාලව බදු සහන ලබාදීම හරහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය දිරිගැන්වේ. ජාතික අවශ්‍යතාවයන් සඳහා පර්යේෂණ මත පදනම් වූ විසඳුම් ලබාදීම සඳහා ජාතික පර්යේෂණ සභාව විසින් රජය - දේශීය ආයතන - අමාත්‍යාංශ - විශ්වවිද්‍යාල - පර්යේෂණ හා සංවර්ධන ආයතන - පෞද්ගලික අංශය - කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රය යන අංශයන් අතර සම්බන්ධීකරණය සිදු කෙරේ.

**<u>වෙනත් වැඩසටහන්:</u>**

සුභසාධන වැඩසටහන් - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ සෑම කාර්තුවකටම වරක් මහජනතාව වෙත පර්යේෂණ ප්‍රදානයන්හී ප්‍රතිලාභයන් ලබාදීමේ අරමුණින් සුභසාධන වැඩසටහනක් පවත්වන ලදී.

මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන් - තම පර්යේෂණයන් විද්‍යාඥයින් විසින් සමාලෝචනය කෙරෙනු ලබන සඟරාවන්හී පළකිරීම සඳහා ප්‍රදානලාභීන් දිරිගන්වනු ලැබේ. ඒ අතරම විද්‍යාඥයින් විසින් සිදු කරනු ලබන පර්යේෂණයන් පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම අරමුණු කරගනිමින් සිය සොයාගැනීම් පුවත්පත්වල පළකිරීම සඳහා විද්‍යාඥයින්ට පහසුකම් සලසා දීම ජාතික පර්යේෂණ සභාව විසින් සිදු කෙරේ.

# විශේෂ අවස්ථා - 2017

## ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන

ජාතික පර්යේෂණ සභාව විසින් 2017 ඔක්තෝම්බර් මසදී, 2018 වසර සඳහා නව ප්‍රදාන සඳහා අයැදුම්පත් කැඳවමින් දැන්වීම් පළ කරනු ලැබිණි.

| | 2014 | 2016 | 2018 |
|---|---|---|---|
| **ලැබූ අයැදුම්පත් සංඛ්‍යාව** | 60 | 50 | 25 |
| **විස්තරාත්මක යෝජනා සඳහා අවසන් කෙටි ලේඛනගත කරනු ලැබූ අයැදුම්පත් සංඛ්‍යාව** | 21 | 11 | 06 |
| **ඉදිරිපත් කිරීම් සඳහා අවසන් කෙටි ලේඛනගත කරනු ලැබූ අයැදුම්පත් සංඛ්‍යාව** | 11 | 06 | දැනට සිදුකෙරේ |
| **පිරිනමන ලද ප්‍රදානයන් සංඛ්‍යාව** | 05 | 03 | දැනට සිදුකෙරේ |

2014 සහ 2016 වර්ෂයන්හීදී පිරිනමන ලද ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ ප්‍රදානයන් 08ක් 2017 වසර තුළදී ක්‍රියාත්මකව පැවති අතර, ජාතික පර්යේෂණ සභාවේ ව්‍යාපෘති සුපරීක්ෂණ උපදේශක, මහාචාර්ය ආර්.බී. මාපා මහතා විසින් දෙවන වසරේ ප්‍රගතිය සුපරීක්ෂණය කරන ලදී.

දැනට ක්‍රියාත්මකව පවතින ඉලක්ක මත පදනම් වූ ප්‍රදාන:

- **වාහකයින් පාලනය භාවිතයෙන් ශ්‍රී ලංකාවේ ඩෙංගු පාලනය සඳහා මෙහෙයුම් ආකෘතියක්, ආරක්ෂක නිෂ්පාදන වැඩිදියුණු කිරීම සහ ප්‍රජාවන් ඒකරාශි කිරීම පිළිබඳ අංගසම්පූර්ණ පර්යේෂණ යෝජනාවක්** (ප්‍ර:අ: ආචාර්ය එම්. හපුගොඩ සහ නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය නිල්මිණී ගුණවර්ධන, කැළණිය විශ්වවිද්‍යාලය)

  මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, ස්වාභාවික අභිජනන වාසස්ථාන අවම කිරීම, නැනෝ තාක්ෂණය භාවිතයෙන් නිපදවූ කෘමිනාශක ගුණයෙන් යුතු ජනේල තිරරෙදි සහ මදුරු දැල් භාවිතයෙන් මදුරුවන් දෂ්ඨ කිරීම අවම කිරීම සහ ඩෙංගු පාලනය සඳහා ප්‍රජා සහභාගීත්වය වැඩිදියුණු කිරීම හරහා රසායන විද්‍යාත්මකව සහ ජෛව විද්‍යාත්මකව ඩෙංගු වාහකයින් පාලනය කිරීමයි.



- **ශ්‍රී ලංකාවේ සර්ප විෂ සඳහා බහුසංයුජතා ප්‍රතිවිෂ වර්ගයක් වැඩිදියුණු කිරීම**

(ප්‍ර:අ: මහාචාර්ය අයි.බී. ගවරම්මාන සහ නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය ඒ. දංගොල්ල, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

නවීන තාක්ෂණික සර්පාගාරයක් වැඩිදියුණු කිරීම හරහා ශ්‍රී ලංකාවේ, වෛද්‍ය විද්‍යාත්මක වැදගත්කමකින් යුත් සර්පයින්ගේ විෂ එක්රැස් කිරීම, විශ්ලේෂණය, ශ්‍රී ලංකාවේදී දෂ්ටනය සඳහා බහුසංයුජතා ප්‍රතිවිෂ වර්ගයක් වැඩිදියුණු කිරීම සහ ශ්‍රී ලංකාවේදී ප්‍රතිවිෂ නිෂ්පාදනය සඳහා අශ්වයින් යොදා ගැනෙන පර්යේෂණ සංකීර්ණයක් ස්ථාපනය කිරීම මෙහි අරමුණ වේ.




- **කිරි නිෂ්පාදනය අතින් ස්වයංපෝෂී තත්ත්වය ළඟාකර ගැනීම සඳහා කිරි කර්මාන්තය වැඩිදියුණු කිරීම**

(ප්‍ර:අ: කේ. මහීපාල මයා සහ නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය තුසිත් සමරකෝන්, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, පෝෂණ කළමනාකරණය වැඩිදියුණු කිරීම, වඩා හොඳ ආහාර සූත්‍ර භාවිතා කිරීම, පැටවුන් බිහි කිරීමේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම, උපරිම ගැබ් ගැනීමේ ශීඝ්‍රතාවයක් සඳහා සමමුහුර්තකරණ ක්‍රියාවලිය භාවිතය, දින 18-20 දී පූර්ව ගැබ් ගැනීම හඳුනාගැනීමේ අඩු වියදම් ක්ෂේත්‍ර කට්ටලයක් හඳුන්වා දීම, මැස්ටයිටීස් රෝගය සඳහා පොදු රෝග නිධාන හඳුනාගැනීම, රෝග හටගැනීම සහ ව්‍යාප්තිය අවම කිරීම සඳහා සුදුසු ප්‍රතිජීවක ඇසුරෙන් ප්‍රතිකාර කිරීම සහ සත්ත්ව සුභසාධනය වැඩිදියුණු කිරීම.



- **ශ්‍රී ලංකාවේ ව්‍යාප්තව පවතින රෝග නිධානය හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ අංගසම්පූර්ණ අධ්‍යයනයක්**

  (ප්‍ර:අ: මහාචාර්ය ආර්.එල්.ආර්. චන්ද්‍රජිත් සහ නියෝජ්‍ය ප්‍ර:අ: මහාචාර්ය ජේ.ජී.එස්. රණසිංහ, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

  මෙහි මුඛ්‍ය පරමාර්ථය වනුයේ, වත්මන සොයාගෙන නොමැති නිදන්ගත වකුගඩු රෝගයේ විවිධ ලක්ෂණ පිළිබඳ දැනුම සොයාගැනීමයි. රෝගයේ ක්‍රමික වර්ධනය සහ මරණයට පත්වීම සඳහා බලපාන සාධක හඳුනාගැනීම සඳහා නිදන්ගත වකුගඩු රෝගයෙන් පෙළෙන රෝගීන්ගෙන් ලබාගත් රුධිර සහ මුත්‍ර සාම්පල විශ්ලේෂණය කරනු ලැබේ. රෝගය ව්‍යාප්තව පවතින ප්‍රදේශයන් වන ගිරාඳුරුකෝට්ටේ සහ විල්ගමුව යන ප්‍රදේශයන්හී අංගසම්පූර්ණ භූ පරිසර අධ්‍යයනයක් සිදුකරනු ලැබූ අතර ළිං, වැව් සහ කුඹුරු ආදියෙන් ලබාගත් ජල සාම්පල ICPMS යන්ත්‍රය, භාවිතයෙන් බැර ලෝහ සඳහා විශ්ලේෂණය කරන ලදී. GIS අනුරූපනය භාවිතයෙන් මහවැලි ප්‍රදේශයන්හී පරිසර දූෂණය පිළිබඳ ඉතිහාසය සොයා බැලීම, මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සිදුකරන ලදී.



- **ශ්‍රී ලංකාව තුළ විවිධ දේශගුණ තත්ත්වයන්ට ගැළපෙන භෝග ප්‍රභේද සහ වගාකිරීමේ ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීම හරහා ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම**

  (ප්‍ර:අ: ආචාර්ය ඩබ්.එම්.ඩබ්. වීරකෝන් සහ නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය ඩී.එම්.ජේ.බී. සේනානායක, ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, මහඉලුප්පල්ලම)

  අධික උෂ්ණත්වයන්ට, පීඩාවන්ට ඔරොත්තු දෙන, වැඩි ඵලදාවක් සහිත පළිබෝධ සහ රෝග සඳහා ඔරොත්තු දෙන / ප්‍රතිරෝධී මිරිස්, බඩඉරිඟු, මුං බීජ සහ සහල් ප්‍රභේද වැඩිදියුණු කිරීම, විවිධ දේශගුණ තත්ත්වයන්ට යෝග්‍ය කෘෂිකාර්මික භාවිතයන් යෝජනා කිරීම; පාංශු තෙතමන දර්ශක භාවිතයෙන් නියඟයන්ට වඩාත් ලක්විය හැකි ප්‍රදේශ හඳුනාගැනීම සහ සිතියම්ගත කිරීම.



■ **ප්‍රමාණවත් ඵලදාවක් පවත්වා ගනිමින් සහ පාංශු සාරවත්භාවය වර්ධනය කරගනිමින් අකාබනික පොහොර භාවිතය අවම කරනු පිණිස පරිසර හිතකාමී වගා තාක්ෂණයන් වැඩිදියුණු කිරීම**

(ප්‍ර:අ: ආචාර්ය සමන් ධර්මකීර්ති, ආචාර්ය ඩබ්.එස්. දන්දෙනිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ, ශ්‍රී ලංකාවේ වී වගාවේදී රසායනික පොහොර භාවිත කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ ඒ හරහා රටෙහි රසායනික පොහොර භාවිතය අවම කරනු පිණිස පරිසර හිතකාමී සහ ගොවිජන හිතකාමී තාක්ෂණයන් වැඩිදියුණු කිරීමය. එමෙන්ම, ශාකවල මනා පැවැත්ම වැඩිදියුණු කරනු පිණිස සහ වී වගා බිමෙහි වෙනත් කෘෂි රසායනයන්හි භාවිතය අවම කරනු පිණිස මෙම තාක්ෂණයන්හි ඵලදායී යෙදවීම පිළිබඳ සොයාබැලීමද මේ හරහා අපේක්ෂිතය. මෙම වැඩිදියුණු කරන ලද තාක්ෂණයන්, පෞද්ගලික අංශයේ ආයෝජකයින් සමඟ ඇති කරගනු ලැබෙන සහයෝගීතාවයන් හරහා ගොවීන් වෙත හඳුන්වා දෙනු ඇත.



■ **භූගත ජලයේ දියවී ඇති සමස්ත ඝන ද්‍රව්‍ය සහ ෆ්ලුවොරයිඩ් සඳහා ප්‍රතිකර්ම යෙදීමේ පහසුකමක ආකෘතියක් වැඩිදියුණු කිරීම - වියළි කලාපීය පානීය ජල ගැටලු සඳහා තිරසර විසඳුමක්**

(ප්‍ර:අ: මහාචාර්ය රෝහිත් වීරසූරිය, ආචාර්ය එස්.කේ. වේරගොඩ, ජාතික මූලික අධ්‍යයන ආයතනය)




වියළි කලාපයේ ජලයේ තත්ත්වය සම්බන්ධයෙන් පැනනැඟ ඇති ගැටලු සඳහා තිරසර විසඳුමක් ලබාදීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මේ යටතේ විද්‍යුත් ආතංචනය (electro-coagulation) සහ නිනිති පටල පෙරීමේ ක්‍රමය (nano membrane filtration) යොදා ගනිමින් ජලයේ අඩංගු අතිරික්ත ෆ්ලුවොරයිඩ සහ සමස්ත දියවූ ඝන ද්‍රව්‍ය නියාමනය කිරීම සඳහා යෝග්‍ය තාක්ෂණය සහිත ජංගම ප්‍රතිකර්ම පහසුකමක් තැනීමට යෝජිතය. මෙම යෝජිත ජල ප්‍රතිකර්ම ආකෘතිය ආරම්භයේදී කුඩා ගම්මාන සඳහා සීමාවනු ඇත. ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ පාලනය යටතේ, මෙම පිරිසිදු ජලය, ජල ප්‍රභවය දර්ශනය වන මානයේ පදිංචි ග්‍රාමීය පාරිභෝගිකයන් වෙත ඔවුන්ගේ එදිනෙදා පරිභෝජනය සඳහා බෙදාහැරීම සිදුකෙරෙනු ඇත. ජල හිඟයෙන් පීඩා විඳින ජන ප්‍රජාවන්ගේ ගැටලු සඳහා කඩිනම් විසඳුමක් ලබාදීමේ අත්‍යාවශ්‍ය පළමු පියවරක් මේ හරහා තැබෙනු ඇත.

- **ජල පවිත්‍රීකරණය සඳහා උසස් ද්‍රව්‍ය මත පදනම් වූ පෙරහන් වැඩිදියුණු කිරීම**
  (ප්‍ර:අ: ආචාර්ය රෝහිණී ද සිල්වා, ආචාර්ය නලින් ද සිල්වා, කොළඹ විශ්වවිද්‍යාලය)

  ජල පවිත්‍රීකරණ ක්‍රියාවලිය සඳහා විදුලිය අවශ්‍ය නොවන, අඩු වියදම් සහ ඵලදායී ජල පෙරහනක්, ග්‍රාමීය ප්‍රජාව වෙත සපයාදීම මෙහි ප්‍රධාන අරමුණයි. මෙම තිරසර ජල පවිත්‍රීකරණ පද්ධතිය දේශීය නිෂ්පාදකයෙකු විසින් නිෂ්පාදනය කෙරෙනු ඇත. මෙහි නිර්මාණය කර ඇති බහුවිධ පද්ධතීන් විසින් බැක්ටීරියා, කාබනික දූෂක ද්‍රව්‍ය, බැරලෝහ සහ අනෙකුත් අකාබනික දූෂක ද්‍රව්‍ය ඉවත් කෙරෙනු ඇත.



# අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන

2017 වර්ෂය ආරම්භ වූයේ ජාතික පර්යේෂණ සභාවේ අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන සඳහා පුවත් පත් දැන්වීමක් පළකිරීම හරහා අයැදුම්පත් කැඳවීමෙනි. මෙම දැන්වීම සියළුම විශ්වවිද්‍යාල, පීඨයන් සහ සියළුම රජයේ පර්යේෂණ හා සංවර්ධන ආයතන අතර බෙදාහරින ලදී.

2017 ජනවාරි 31 දින අයැදුම්පත් භාරගැනීමේ කාලය නිමාවට පත් වූ අතර අයැදුම්පත් 105ක් ලැබී තිබුණි. පළමු කාර්තුව තුළදී දැනට ක්‍රියාත්මක ප්‍රදානයන්ගේ වාර්ෂික ප්‍රගති වාර්තාවන් ඇගැයීම් සඳහා යවන ලදී.

මෙම ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ දැනුමකින් යුතු ඇගැයීම්කරුවන් වෙත මෙම අයැදුම්පත් (2017) යවනු ලැබිණි. සාකච්ඡා මණ්ඩල හරහා, ජාතික පර්යේෂණ සභාව විසින් තවදුරටත් අයැදුම්පත් පරීක්ෂාවට ලක්කොට ඉහළ මට්ටමේ විද්‍යාත්මක කුසලතාවයක් සහ ජාතික අදාලත්වයක් පෙන්නුම් කෙරෙන අයැදුම්පත්, ප්‍රදානය සඳහා තෝරාගනු ලැබිණි.

| ක්‍රියාකාරකම | 2015 | 2016 | 2017 |
|---|---|---|---|
| **ඇගයීමෙන් පසු මූල්‍යනය සඳහා තෝරාගත් අයැදුම්පත් සංඛ්‍යාව** | 53 | 36 | 33 |
| **මූල්‍යනයකරනු ලැබූ ප්‍රදාන සංඛ්‍යාව** | 50+11* | 34 | 32 |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන හරහා පිරිනමනු ලැබූ ප්‍රදානයන්හී මුළු වටිනාකම | රු. මි. 218.0 | රු. මි. 107.6 | රු. මි. 128.7 |

* පූර්ව වර්ෂයේදී තෝරාගනු ලැබූ ප්‍රදානයන්

ඉදිරිපත් කරනු ලැබූ අයැදුම්පත් අතරින් 31% (33/105)ක් පමණක් තෝරාගනු ලැබිණි. තෝරාගනු ලැබූ අයැදුම්පත් මූල්‍යනය සඳහා මහාභාණ්ඩාගාරය වෙත යොමු කරන ලදී.

මෙමවර්ෂයතුළදී, 2017 වර්ෂයේදී ඉදිරිපත් කරනු ලැබූ අයැදුම්පත් ඇසුරෙන් පර්යේෂණ ප්‍රදාන 32ක් මූල්‍යයනය කරනු ලැබ, එම ප්‍රදානයන්හී කටයුතු ආරම්භ කෙරිණි.

වර්ෂය අවසානයේදී, ප්‍රදානයන් 16ක් සඳහා අවසාන ඇගැයීම් සම්පූර්ණ කරනු ලැබ තිබිණි.

මූල්‍යයනය කළ පර්යේෂණ ප්‍රදාන 2017

| Grant No. | Principal Investigator & Institution | Title |
|---|---|---|
| 17-006 | Prof. G. A. K. S. Perera<br>Wayamba University of Sri Lanka | Value addition to Sri Lankan natural rubber in the field of Power and Energy |
| 17-007 | Dr. R. T. De Silva<br>Sri Lanka Institute of Nanotechnology | Using Nano/micro-capsules for Self-healing Epoxy Composites |
| 17-008 | Dr. J. M. K. J. K. Premarathne<br>Wayamba University of Sri Lanka | Risk assessment of foodborne pathogens in food commodities available in the Sri Lankan market and application of biocontrol measures to ensure food safety |
| 17-010 | Prof. D. M. De Costa<br>University of Peradeniya | Analysis of pesticide residues and evaluation of some beneficial effects along with farmer perception of an eco-friendly crop management package for chili and tomato in comparison to existing commercial cultivation practices conducted in Sri Lanka |
| 17-011 | Dr. R. R. Ratnayake<br>National Institute of Fundamental Studies | Development of baseline soil information system for soil C and other nutrients for paddy growing soils in Sri Lanka |
| 17-017 | Prof. J. P. Eeswara<br>University of Peradeniya | Rapid multiplication and Production of Agarwood Fragrant Constituents by Plant Cell and Tissue Culture of *Gyrinopsis walla* |
| 17-018 | Dr. K. V. D. S. Chathuranga<br>University of Moratuwa | Design and Development of a Soft Orthotic Device for Lower Limb and Spinal Assistance |
| 17-019 | Dr. Chamindu Deepagoda<br>University of Peradeniya | Launching a Greenhouse Gas Emissions Technology Evaluation Center (GRETEC) |
| 17-020 | Prof. Kamani Tennekoon<br>Institute of Biochemistry Molecular Biology and Biotechnology (IBMBB) | Mutations and polymorphisms of mitochondrial genes as risk factors for sporadic breast cancer in Sri Lankan patients of Sinhalese ethnicity |
| 17-025 | Dr. A. M. C. P. K. Attanayake<br>University of Peradeniya | Baseline concentrations, solubility and spatial variability of potentially toxic trace elements in soils in Up- and Mid-country Wet zone in Sri Lanka |
| 17-027 | Prof. S. P. Benjamin<br>National Institute of Fundamental Studies | Taxonomic revisions of jumping spider subfamilies Ballinae and Spartaeinae of Sri Lanka based on morphology and DNA barcodes |
| 17-028 | Dr. D. M. U. A. K. Premarathne<br>University of Ruhuna | Igneous rocks in the Mannar Basin as potential evidence from Sri Lanka for the juxtaposition of the Reunion Hotspot and the impacts of the igneous rocks on the hydrocarbon exploration in the Mannar Basin |
| 17-029 | Dr. A. P. Attanayake<br>University of Ruhuna | Development of an antidiabetic agent from *Coccinia grandis* (L.) Voigt (Cucurbitaceae) for diabetes mellitus |

| | | |
|---|---|---|
| 17-033 | Dr. Susanthi Jayasinghe<br>University of Peradeniya | Combined therapeutic drug leads for antidiabetic and anti-hyperlipidaemic treatments from the selected combined medicinal plants |
| 17-037 | Prof. A. L. T. Hewawasam<br>University of Peradeniya | Investigation of Weathering and Erosional Processes in the Catchment of the Ma Oya Tributary of the Mahaweli River |
| 17-038 | Dr. D. D. C. Wanniarachchi<br>University of Sri Jayewardenepura | An automated system to quality control the fermentation stage in black tea manufacturing process |
| 17-042 | Dr. Ruwandi Ranasinghe<br>Institute of Biochemistry, Molecular Biology and Biotechnology (IBMBB) | Insight for molecular Anthropology of early people in Sri Lanka: Ancient human mtDNA and Molecular sex analysis of archeological skeletal remains at Udupiyangalge and Alugalge caves |
| 17-047 | Dr. H. D. Yapa<br>University of Peradeniya | Optimization of shear retrofilling of RC beams via non-linear numerical analysis |
| 17-054 | Prof. U. L. B. Jayasinghe<br>National Institute of Fundamental Studies | Bioactive metabolites of endophytic fungi from the medicinal plants *Coccinia grandis, Costus speciosus and Gymnema sylevestre* used in indigenous medicine for treatment of diabetes mellitus and possible commercial applications |
| 17-055 | Dr. Y. S. Wijayasinghe<br>University of Kelaniya | Molecular characterization of carbapenemase producing enterobacteria (CPE) isolated from a tertiary care teaching hospital in Sri Lanka & validation of a rapid CPE detection protocol |
| 17-058 | Dr. B. L. W. K. Balasooriya<br>Wayamba University of Sri Lanka | Temporal variation of cyanobacterial community in fertilized and long-term unfertilized tropical rice fields |
| 17-060 | Prof. W. K. Mampearachchi<br>University of Moratuwa | Adaptation of Mechanistic Pavement Design Guide for Road Designed based on Empirical Design Methods. |
| 17-064 | Dr. M. S. D. Fernando<br>University of Moratuwa | Improving effectiveness of Massive Open Online Courses (MOOCs) to meet the 21st century challenges |
| 17-065 | Dr. K. T. M. U. Hemapala<br>University of Moratuwa | Adaptive Protection of Microgrids Using Graph theory and Optimization algorithms |
| 17-066 | Dr. P. I. A. Gomes<br>Sri Lanka Institute of Information Technology | Ecological rehabilitation of canals in Colombo: a design to harmonize flood control and physical heterogeneity |
| 17-069 | Dr. A. G. Buddhika P. Jayasekara<br>University of Moratuwa | Intelligent wheelchair robot with human like interactive features for domestic environments |
| 17-072 | Dr. Susantha Siriwardana<br>Rubber Research Institute of Sri Lanka | Evaluation of structural, rheological and mechanical properties of ternary composites of filled Thermoplastics (TP) and Skim Natural Rubber (SNR) blends: a novel route for value addition to skim natural rubber |
| 17-074 | Dr. M. A. P. C. Piyathilaka<br>Wayamba University of Sri Lanka | Molecular phylogeny of marine macro algae (sea weeds) present in Sri Lankan coasts and isolation of anti-cancer compounds to target oral cancers from marine macro algae |

| | | |
|---|---|---|
| 17-086 | Dr. T. S. Palihawadana<br>University of Kelaniya | The steroid profile of follicular fluid in In Vitro Fertilization (IVF) treatment cycles with a standard controlled ovarian stimulation GnRH antagonist regimen and with adjuvant of Letrozole among women with polycystic ovary syndrome and non-PCOS, and its relationship with oocyte number, quality, fertilization rate and implantation rate |
| 17-094 | Dr. N. U. A. Jayasena<br>University of Peradeniya | Avian feathers as bio indicators of exposure to toxic trace elements and links between trophic position, genetic diversity and reproductive success |
| 17-095 | Dr. K. M. G. G. Jayasuriya<br>University of Peradeniya | Seed storage behaviour of fifty keystone rainforest species from Sri Lanka: Towards Conservation of Biodiversity |
| 17-098 | Prof. Shiroma Handunnetti<br>Institute of Biochemistry, Molecular Biology and Biotechnology (IBMBB) | Detection of genotypes and serotypes of Leptospira isolated from severe leptospirosis patients |

# විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය

දස වන වරට පවත්වනු ලැබූ විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානෝත්සවය කොළඹ, ටාජ් සමුද්‍ර හෝටලයේදී, 2017 නොවැම්බර් 06 දින පවත්වන ලදී.

ප්‍රසාරිත විද්‍යා සඳහන් දර්ශනයේ ශ්‍රේණිගත සඟරාවල, ප්‍රකාශන පළකල විද්‍යාඥයින් 295දෙනෙකු සඳහා (2015 වසරට අදාළව) සම්මාන පිරිනමන ලදී. 2015 වසර තුළදී වෛද්‍ය විද්‍යාව, කෘෂිකර්මය සහ ඉංජිනේරු විද්‍යාව ඇතුළත් විෂයයන් පිළිබඳ පළවූ ප්‍රකාශන 500කට අධික සංඛ්‍යාවක් සඳහා සම්මාන පිරිනැමිණි.

මෙම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහභාගී වූ අතර විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ ගරු රාජ්‍ය අමාත්‍ය ලක්ෂමන් සෙනෙවිරත්න මැතිතුමා සහ අමාත්‍යාංශ ලේකම් උදය සෙනෙවිරත්න මැතිතුමන් ද ගෞරවණීය ආරාධිතයින් ලෙස සහභාගී වූහ. තවද, පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හී, විශ්වවිද්‍යාලයන්හී සම්භාවනීය ආරාධිතයින්ද, සම්මාන ලැබූවන්ද මෙම අවස්ථාව සඳහා සහභාගී වූහ.

ජාතික පර්යේෂණ සභාව විසින් ජනාධිපති ලේකම් කාර්යාලය සහ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් මෙම උළෙල සංවිධානය කරන ලදී.







for Scientific Publication

விஞ்ஞான ஆய்வுக்கான ஜனாதிபதி
President's Awards for Scientific



ntific Publication


President's Awards for Scientific
විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය
விஞ்ஞான, தொழில்நுட்பவியல் மற்றும் ஆராய்ச்சி அமைச்சு
Ministry of Science, Technology and Research


# රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා වැඩසටහන

මෙම කාලසීමාව තුලදී රාජ්‍ය පෞද්ගලික සහයෝගීතා වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි.

| ක්‍රියාකාරකම් | 2015 | 2016 | 2017 |
|---|---|---|---|
| රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතාවය සඳහා ලද EOI සංඛ්‍යාව | 6 | 12 | 10 |
| විස්තරාත්මක යෝජනාවන් ඉදිරිපත් කිරීම සඳහා තෝරාගත් EOI සංඛ්‍යාව | 4 | 9 | 4 |
| පෞද්ගලික අංශය සමඟ පහසුකම් සපයාගත යුතු සහයෝගීතාවයන් සංඛ්‍යාව | 1 | 3 | 2 |
| අවශ්‍ය මුළු මුදල | රු. මි.12.27 | රු. මි.56.687 | රු. මි.6.84 |
| පෞද්ගලික අංශය මඟින් සපයනු ලැබූ මුදල (දළ වශයෙන් 50%) | රු. මි.6.17 | රු. මි.28.343 | රු. මි.3.42 |

**දැනට ක්‍රියාත්මක රාජ්‍ය පෞද්ගලික සහයෝගීතාවයන්...**

| පර්යේෂණ සහකරු | ව්‍යාපෘති නාමය |
|---|---|
| ආචාර්ය එස්.එම්.සී.යූ.පී. සුබසිංහ<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | Variation of naturally and artificially induced agarwood resin content and quality of *Gyrinops walla* for commercial extraction and its nursery establishment |
| මහාචාර්ය සරෝජ් ජයසිංහ<br>කොළඹ විශ්වවිද්‍යාලය | Investigation into the effect of drinking and cooking water with reduced fluoride content and hardness, on the prevalence, incidence and severity of chronic kidney diseases of uncertain aetiology (CKDu) in a selected G.N. Division in Vavuniya District |
| ආචාර්ය ශාන්ත වල්පලගේ<br>මොරටුව විශ්වවිද්‍යාලය | Development of a material using natural rubber and polyethylene as a substitute to conventional roofing sheets |
| ජී.එල්.සී. ගලහිටියාව මහතා<br>තේ පර්යේෂණ ආයතනය | Development of Self-Cleaning Sifter with multiple mesh frames for grading long leafy & wiry type tea |
| ආචාර්ය අනිල් ගුණතිලක<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | Locally Developed Sustained Release Tablets |

| පර්යේෂණ සහකරු | ව්‍යාපෘති නාමය |
|---|---|
| ආර්.එම්. ධර්මදාස මහතා<br>කාර්මික තාක්ෂණ ආයතනය | Extraction and formulation of plant protection products from endemic plants for healthy growth of crops free from sucking insects(mealybugs, aphids, whiteflies and thrips) causing yellowing, wilting and leaf-curl |
| ආචාර්ය එන්.එම්.එස්. සිරිමුතු<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | Nanomaterials for improved electrical conductivity of natural rubber compound for non-marking solid tires |
| මහාචාර්ය එන්.කේ.බී. අදිකාරම්<br>ජාතික මූලික අධ්‍යයන ආයතනය | Study of a postharvest disease and disorders adversely affecting the export potential of mango var. TomEJC and their management |

# වෙනත් වැඩසටහන්

මෙම කාලසීමාව තුළ එක් සුහසාධන වැඩසටහනක් පවත්වන ලදී.

| | |
|---|---|
| පළමු සුහසාධන වැඩසටහන 2017<br>ජා:ප:ස: ප්‍රදාන අංක: 11-056 | **“ජෛව පටල ජෛව පොහොර වඩා හරිත ශ්‍රී ලංකාවක් උදෙසා (නුවරඑළිය ප්‍රදේශයේ එළවළු වගාව පිළිබඳ විශේෂිත අවධානය යොමුකරමින්)”** |
| | **සම්පත් දායකයින්:** ආචාර්ය ගාමිණී සෙනෙවිරත්න (ජා:ප:ස: ප්‍රදාන අංක: 11-056, ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS) සහ ඉංජිනේරු සමුදිත කුමාරසිංහ, අධ්‍යක්ෂ මෙහෙයුම්, සී/ස ලංකා බයෝ ෆර්ටිලයිසර්ස් (පෞද්.) සමාගම |
| | **ඉලක්කගත ප්‍රතිලාභීන්:** නුවරඑළිය, සීතාඑළිය සහ කඳපොළ ප්‍රදේශයන්හී ගොවීන් සහ කෘෂිකර්ම නිලධාරීන් |



| | |
|---|---|
| **පොලිතීන්හි තිරසර කළමනාකරණය** | අපගේ 2017 වසර සඳහා වන සුහසාධන වැඩසටහනෙහි එක් කොටසක් ලෙස, ජාතික පර්යේෂණ සභාව විසින්, ජනාධිපති ලේකම් කාර්යාලය, විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය, තිරසර සංවර්ධන සහ වනජීවී අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරිය හා එක්ව පොලිතීන්හි තිරසර කළමනාකරණය සඳහා වැඩසටහනක් දියත් කෙරෙනු ඇත. |
| | **සම්පත් දායකයින්:** එච්.එම්.පී. බණ්ඩාර මහතා, ප්‍රධාන ලේකම්, උතුරු මැද පළාත, මහාචාර්ය ජනක ද සිල්වා, සභාපති, ජාතික පර්යේෂණ සභාව, කේ.එච්. මුතුකුඩආරච්චි මහතා, අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය, ආචාර්ය විමල් විමලදාස, ව්‍යාපෘති අධ්‍යක්ෂ, Re-resource ව්‍යාපෘතිය, ඊ.එම්.එන්.ඩබ්. ඒකනායක මිය, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, උතුරු මැද පළාත සහ එම්. කොඩිප්පිලි ආරච්චි මෙය, පළාත් පාලන කොමසාරිස්, උතුරු මැද පළාත |

| | |
|---|---|
| | **ඉලක්කගත ප්‍රතිලාභීන්:** උතුරු මැද පළාතේ පළාත් සභාවේ නිලධාරීන් 120ක් |




| | |
|---|---|
| අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ (TOT) වැඩසටහන | ජාතික පර්යේෂණ සභාව විසින් උතුරු මැද පළාතේ ගුරු උපදේශකවරුන් සහ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන් දෙකක් සංවිධානය කරන ලදී. |
| | **සම්පත් දායකයින්:**<br>මහාචාර්ය සරත් කොටගම, මහාචාර්ය ජගත් ප්‍රේමචන්ද්‍ර<br>ආචාර්ය වරුණ ගුණතිලක, බන්දුල සරත් කුමාර මයා |
| | **ඉලක්කගත ප්‍රතිලාභීන්:** ගුරු උපදේශකවරුන් සහ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් |





| | |
|---|---|
| පොළොන්නරුව දිස්ත්‍රික්කය සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ (TOT) වැඩසටහන | ජාතික පර්යේෂණ සභාව විසින් උතුරු මැද පළාතේ ගුරු උපදේශකවරුන් සහ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන් දෙකක් සංවිධානය කරන ලදී. |
| | **සම්පත් දායකයින් :** මහාචාර්ය සරත් කොටගම, මහාචාර්ය අජිත් ද අල්විස්, මහාචාර්ය අනුජ ප්‍රේමවර්ධන, ආචාර්ය විමල් විමලදාස, මහාචාර්ය ජනක ද සිල්වා |
| | **ඉලක්කගත ප්‍රතිලාභීන් :** ගුරු උපදේශකවරුන් සහ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් |






| | |
|---|---|
| ස්වාධීන රූපවාහිනී මාධ්‍ය වැඩසටහන | **හිඟුරක්ගොඩ ආනන්ද බාලිකා විද්‍යාලයේ පැවැති ස්වාධීන රූපවාහිනී "මාධ්‍ය ප්‍රදීප" වැඩසටහන සමඟ ජාතික පර්යේෂණ සභාව එක්වේ.** |
| | **සම්පත් දායකයින්** : ආචාර්ය හසන්ත හෙට්ටිආරච්චි / ජාතික රූපවාහිනී ජාලය, ප්‍රධාන විධායක නිලධාරී, චන්දන තිලකරත්න මහතා |
| | **ඉලක්කගත ප්‍රතිලාභීන් :** පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පාසැල් සිසුන් 850ක් |




| | |
|---|---|
| දිඹුලාගල අධ්‍යාපන කලාපය සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ (TOT) වැඩසටහන | ජාතික පර්යේෂණ සභාව විසින් දිඹුලාගල අධ්‍යාපන කලාපයේ ගුරුවරුන් සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී. |
| | **සම්පත් දායකයින් :** සම්පත් නෝනිස් මහතා, නදීකා දිසානායක මෙය |
| | **ඉලක්කගත ප්‍රතිලාභීන් :** දිඹුලාගල අධ්‍යාපන කලාපයේ ගුරුවරුන් 50දෙනෙක් |









# වාර්ෂික ගිණුම් - 2017

# විගණකාධිපතිගේ වාර්තාව

# සම්බන්ධවිය හැකි අයුරු පිළිබඳ තොරතුරු


**ජාතික පර්යේෂණ සභාව**

**120/7, විද්‍යා මාවත, කොළඹ 07.**

| | | | | | |
|---|---|---|---|---|---|
| **පොදු දුරකථන** | **:** | **011-2675176** | **ෆැක්ස්** | **:** | **011-2675136** |
| **ඊ-මේල්** | **:** | admin@nrc.gov.lk | **වෙබ් අඩවිය** | **:** | www.nrc.gov.lk |

# වාර්ෂික ගිණුම් ප්‍රකාශන - 2017

## ජාතික පර්යේෂණ සභාව

**2018 පෙබරවාරි 08**

ජාතික පර්යේෂණ සභාව
120/07, විද්‍යා මාවත, කොළඹ 07
වෙබ් ලිපිනය: www.nrc.gov.lk   ඊ-මේල්: nrc@sltnet.lk

# 2017 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන

*මූල්‍යමය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය*

*මූල්‍යමය කාර්යසාධන ප්‍රකාශනය*

*මුදල් ප්‍රවාහ ප්‍රකාශය*

*ශුද්ධ වත්කම්/ හිමිකම වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය*

*මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්*

**ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව**

## 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍යමය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන් | 2017<br>රු. | 2016<br>(නැවත ප්‍රකාශිත)<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | | 33,704,772.25 | 29,549,046.18 |
| විශේෂ අත්තිකාරම් | | - | 178,500.00 |
| ඉලක්කගත බහුවිෂයානුබද්ධ ප්‍රදාන වැඩසටහන | 1 | 219,639,605.12 | 220,027,094.40 |
| ජා:ප:ස: ප්‍රදාන | 1 | 269,097,441.61 | 289,141,670.91 |
| ජා:ප:ස: රාජ්‍ය, පෞද්ගලික සහයෝගීතා වැඩසටහන | 1 | 33,593,592.26 | 35,687,146.05 |
| වෙනත් ජංගම වත්කම් | | | |
| | | **556,035,411.24** | **574,583,457.54** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| වෙනත් මූල්‍ය වත්කම් | 2 | 1,971,000.00 | 1,971,000.00 |
| දේපළ, පිරියත හා උපකරණ | 3 | 297,079,066.65 | 281,483,722.71 |
| | | **299,050,066.65** | **283,454,722.71** |
| **මුළු වත්කම්** | | **855,085,477.89** | **858,038,180.25** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු දෑ | 4 | 609,881.78 | 372,759.95 |
| | | 609,881.78 | 372,759.95 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | | 343,145.00 | 242,185.00 |
| | | 343,145.00 | 242,185.00 |
| **මුළු වගකීම්** | | 953,026.78 | 614,944.95 |
| **ශුද්ධ වත්කම්** | | **854,132,451.11** | **857,423,235.30** |
| **ශුද්ධ වත්කම්/ ස්කන්ධය** | | | |
| ප්‍රාග්ධනය සඳහා දායකත්වය; | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන | | 802,186,494.40 | 806,562,010.26 |
| සංචිත | | | |
| සමුච්චිත අතිරික්තය/ (හිඟය) | | 51,945,956.71 | 50,861,225.04 |
| සුළු කොටස් අයිතිය | | | |
| **මුළු ශුද්ධ වත්කම්/ ස්කන්ධය** | | 854,132,451.11 | **857,423,235.30** |

**පිටු අංක 06 සිට 11 දක්වා සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක 12 සිට 19 දක්වා සඳහන් කර ඇති සටහන් සඳහා මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි ප්‍රධාන කොටසක් ඇතුලත් වේ. මෙම මූල්‍ය ප්‍රකාශය සැකසීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම සභාව සතුවේ. මෙම මූල්‍ය ප්‍රකාශය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත පරිදි අත්සන් තැබේ.**

| | | | |
|---|---|---|---|
| **මහාචාර්ය එච්.ජේ. ද සිල්වා** | **ටී.ඒ. රත්නසීල** | **එම්.සී. රාජපක්ෂ** | **එම්.ජී.ආර්.එන්. සමන්කුමාරි** |
| **සභාපති/ ජාතික පර්යේෂණ සභාව** | **සභාවෙහි කම්ටු සාමාජික** | **විධායක ලේකම්** | **ගණකාධිකාරී** |

**ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව**
**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍යමය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන් | 2017<br>රු. | 2016<br>(නැවත ප්‍රකාශිත)<br>රු. |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| පුනරාවර්තන ලැබීම් - ජා:ප:ස: පරිපාලනය | *5* | 20,981,436.00 | 16,679,325.00 |
| මූලධන ප්‍රදාන | | 1,378,411.25 | 927,914.07 |
| පුනරාවර්තන ලැබීම් - පර්යේෂණ හා සංවර්ධන | *6* | 181,404,230.42 | 183,220,198.13 |
| වෙනත් ලැබීම් | | 1,424,599.24 | 1,590,522.25 |
| හුවමාරුවෙන් ලද මුදල් - ජා:ප:ස: | | 133,526.19 | 759,634.55 |
| නිවෙස් කුලී පියවීම | | | 707,516.00 |
| **මුළු ආදායම** | | **205,322,203.10** | **203,885,110.00** |
| **වියදම්** | | | |
| පුද්ගල වේතන | | 8,507,396.03 | 9,000,840.96 |
| පර්යේෂණ හා සංවර්ධන | *7* | 135,594,587.30 | 142,530,222.32 |
| සැපයුම් සහ පරිභෝජන | *8* | 11,238,737.54 | 7,751,332.33 |
| ක්ෂය වියදම් - ජා:ප:ස: ප්‍රදාන | | 45,809,643.12 | 40,689,975.81 |
| ක්ෂය - ජා:ප:ස: කාර්යාල උපකරණ | | 1,378,411.25 | 927,914.07 |
| වෙනත් වියදම් | | 1,558,920.00 | 1,637,200.00 |
| මූල්‍ය පිරිවැය | | 16,250.00 | 16,250.00 |
| හුවමාරුවෙන් ලද මුදල් - ජා:ප:ස: | | 133,526.19 | 759,634.55 |
| **මුළු වියදම්** | | **204,237,471.43** | **203,313,370.04** |
| අතිරික්තයෙන් ආශ්‍රිතයන් සඳහා වෙන්කරන කොටස | | | |
| විද්‍යාත්මක ප්‍රකාශන වැඩසටහන සඳහා ජනාධිපති සම්මාන (PASP) (2001 වර්ෂයේදී ආරම්භ කෙරිණි.) | පවත්වනු ලැබූ උත්සව හා සම්මානලාභී විද්‍යාඥයින් සංඛ්‍යාව | 2013 වර්ෂය සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය කිරීමේ උළෙල පවත්වන ලද අතර විද්‍යාඥයින් 211 දෙනෙකු සඳහා සම්මාන ප්‍රදානය කෙරිණි. | 2014 වර්ෂය සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය කිරීමේ උළෙල පවත්වන ලද අතර විද්‍යාඥයින් 232 දෙනෙකු සඳහා සම්මාන ප්‍රදානය කෙරිණි. | 2015 වර්ෂය සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය කිරීමේ උළෙල පවත්වන ලද අතර විද්‍යාඥයින් 295දෙනෙකු සඳහා සම්මාන ප්‍රදානය කෙරිණි. | - | - | - |
| | | | | | | | |
| වෙනත් වැඩසටහන්: සමාජ සුභසාධන/ මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් | සම්පූර්ණ කරනු ලැබූ ක්‍රියාකාරකම් | සමාජ සුභසාධන වැඩසටහන් 4ක් පවත්වන ලදී.<br><br>ජාතික පර්යේෂණ සභාව විසින් පවත්වනු ලැබූ පර්යේෂණයන් පිළිබඳ පුවත්පත් ලිපි 11ක් ප්‍රකාශයට පත්කරනු ලැබිණි. | සමාජ සුභසාධන වැඩසටහන් 4ක් පවත්වන ලදී.<br><br>ජාතික පර්යේෂණ සභාව විසින් පවත්වනු ලැබූ පර්යේෂණයන් පිළිබඳ පුවත්පත් ලිපි 50ක් ප්‍රකාශයට පත්කරනු ලැබිණි. | සමාජ සුභසාධන වැඩසටහන් 6ක් පවත්වන ලදී.<br><br>ජාතික පර්යේෂණ සභාව විසින් පවත්වනු ලැබූ පර්යේෂණයන් පිළිබඳ පුවත්පත් ලිපි 40ක් ප්‍රකාශයට පත්කරනු ලැබිණි. | - | - | - |
| **එකතුව** | | | | | **285.37** | **247.60** | **199.62** |

# ජාතික පර්යේෂණ සභාවේ වැඩසටහන්

**ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන:**

ගැටලු පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම හෝ සංකීර්ණ ගැටලු විසඳාලීම සඳහා ඒකෙක පර්යේෂණ හරහා හැකියාව ලැබෙනුයේ අල්ප වශයෙනි. බහුවිෂයානුබද්ධ ප්‍රවේශයක් අනුගමනය කිරීමෙන් සාමාන්‍ය සීමාවන්ට පරිබාහිර ගැටලු නැවත අර්ථදැක්වීම සහ දුෂ්කර ගැටලු අලුතින් අවබෝධ කරගැනීම හරහා විසඳුම් වෙත එළැඹීමට හැකිවන පරිදි බහුවිධ විෂයයන් වෙතින් සුදුසු පරිදි දායකත්වයන් ලබා ගැනේ.

මෙම වැඩසටහන 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් යෝජිත පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම් ඉතා කඩිනමින් අවශ්‍ය වන, අතිශය වැදගත් අංශයන් 10ක් හා අනුගතව ක්‍රියාත්මක කෙරිණි.

රාජ්‍ය විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන ආයතන සහ විශ්වවිද්‍යාලයන්හී පර්යේෂක පිරිස් වෙතින් පූර්ව යෝජනා කැඳවන ලදී. ආර්ථික සංවර්ධනය, සමාජ සුභසාධනය සහ රටෙහි පාරිසරික තිරසරභාවය අරමුණු කරගනිමින්, ජාතික වශයෙන් අදාළත්වයක් සහිත ගැටලු විසඳාලීම මෙම ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ව්‍යාපෘති හරහා සිදුකිරීමට අපේක්ෂිතය.

ප්‍රතිපත්ති/ ක්‍රමෝපාය හෝ නිෂ්පාදන සංවර්ධනය සඳහා අවශ්‍ය දැනුමෙහි පවතින ප්‍රධාන පරතරයන් විසඳාලීම, දේශයෙහි ප්‍රගමනය සඳහා බාධක හෝ අභියෝග එල්ල කෙරෙන ගැටලු විසඳාලීම මෙම ව්‍යාපතීන්හී අරමුණු වේ. පර්යේෂණ ප්‍රතිඵල ප්‍රතිපත්ති, ක්‍රමෝපායයන්, නිෂ්පාදන/ ක්‍රියාවලි සංවර්ධනය කිරීම සහ ඒවා පිළිබඳ අවබෝධයක් ලබාගැනීම සඳහා වන ගමන් මඟ පැහැදිළිව හඳුනාගත යුතුය.

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ජාතික පර්යේෂණ හා සංවර්ධන ප්‍රතිපත්ති රාමුව (වැදගත් ක්ෂේත්‍ර 10) සමඟ අනුගත වෙමින් ප්‍රමුඛ ක්ෂේත්‍රයන් කිහිපයක් වෙතින් යෝජනා කැඳවනු ලැබිණි. එක් ප්‍රදානයක වටිනාකම මිලියන 50ක් වන අතර වසර 5ක කාලසීමාවක් සඳහා මෙම ප්‍රදානයන් සිදුකරයි. ජාතික පර්යේෂණ සභාව විසින් සැලකිය යුතු අන්දමේ මහජන මුදල් ප්‍රමාණයක් මෙම ව්‍යාපෘතීන් සඳහා ආයෝජනය කරන හෙයින්, මේ සඳහා මූල්‍යනය ඉතා ඉහළ තරඟකාරී පදනමකින් සිදුකෙරෙනු ඇත. වසර 5ක කාලයකට පසු සැලකියයුතු අන්දමේ ප්‍රතිඵලයක් ලබාදීමේ හැකියාවක් ඇති බවට ජාතික පර්යේෂණ සභාව විසින් සලකනු ලබන, ව්‍යාපෘතීන්හී කණ්ඩායමක් වශයෙන් එක්ව ක්‍රියා කළ හැකි කුසලතා සහිත, ඉතා සුදුසු පර්යේෂකයින් පමණක් තෝරාගැනීමට ජාතික පර්යේෂණ සභාව විසින් කටයුතු කෙරෙනු ඇත. පර්යේෂණයන්හී විවිධ අංශයන් පිළිබඳව කණ්ඩායමේ සාමාජිකයින් විසින් සමගාමී ලෙස කටයුතු කිරීමේ වාසිය මෙම බහුවිෂයයන් මත කේන්ද්‍රගත වූ ව්‍යාපෘති හරහා උදාවනු ඇත.

ප්‍රදානයෙහි මෙහෙයුම් බොහෝදුරට සමාන වනුයේ අන්වේෂක මත පදනම් වූ ප්‍රදානයන්ටය. කෙසේ වුවද, ප්‍රධාන අන්වේෂක තනතුරට අමතරව නියෝජ්‍ය අන්වේෂකයෙකුද පත්කෙරෙනු ඇත. මෙම ප්‍රදාන සිදුකිරීමෙන් අනතුරුව, ප්‍රකාශිත ප්‍රතිඵලයන් ළඟාකරගන්නා බවට සහතික කරනු වස් විධිමත් සහ දැඩි සන්නිරීක්ෂණයන්, සුපරීක්ෂණයන් සහ ඇගැයීම් යටතට මෙම ව්‍යාපෘතීන් පත්කෙරෙනු ඇත.

**අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදානවැඩසටහන:**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන සහ විශ්වවිද්‍යාල විසින් සිදු කෙරෙන පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ප්‍රධාන වශයෙන් මූල්‍යාධාර සැපයෙනුයේ රාජ්‍ය ආයතනික ප්‍රතිපාදන, තරඟකාරී ප්‍රදාන සහ පර්යේෂණ කොන්ත්‍රාත්තු වැනි විවිධ ප්‍රභවයන් වෙතිනි. ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන ආරම්භ කරනු ලැබුයේ විද්‍යාඥයින්හට අවම පරිපාලන අවහිරතා යටතේ සිය පර්යේෂණ කාර්යයන්හී නියැලීමට ඉඩ ප්‍රස්ථා ලබා දීමේ අරමුණෙනි.

ජාතික පර්යේෂණ සභාවෙහි පර්යේෂණ ප්‍රදාන වැඩසටහන හරහා රජයේ ආයතන සඳහා පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීම පිණිස තරඟකාරී ප්‍රදානයන් ලබා දීම සිදු කෙරේ. මෙම වැඩසටහන ක්‍රියාත්මක වූ කාලසීමාව තුල එය මනාව සංවිධිත කරනු ලැබිණි. මෙම ප්‍රදානයන් පිළිබඳව වාර්ෂිකව දැන්වීම් පළකෙරෙන අතර, විද්‍යාත්මක සංරචකය, ජාතික සංවර්ධනය සඳහා ඇති අදාලත්වය සහ ජාත්‍යන්තර සඟරාවන්හී මෙම සොයාගැනීම් පළවීම යන කරුණු මත ඇගයීම සිදු කෙරේ.

අයැදුම්පත් දැඩි ඇගයීමේ ක්‍රියාවලියකට ලක් කෙරේ. තෝරාගනු ලබන යෝජනාවන් සඳහා සුදුසු ප්‍රතිපාදන වෙන්කිරීම් පිළිබඳව සභාව විසින් තීරණය කෙරෙනු ඇති අතර මෙම ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයේ සිට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ තනි වගකීම දරණ ප්‍රධාන විමර්ශකයා වෙත සෘජුවම ලබාදේ. උපකරණ සහ පාරිභෝගික ද්‍රව්‍ය ආදිය සඳහා මෙම ප්‍රතිපාදන වෙන්කෙරේ. එක් එක් ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති බැංකු ගිණුමක් විවෘත කෙරෙන අතර ජාතික පර්යේෂණ සභාව විසින් සියළු ගණුදෙණු සුපරීක්ෂණය කෙරේ. පරිපාලන අවහිරතා අවම මට්ටමක තබා ගිනිමින් මෙම අරමුදල් ප්‍රයෝජනයට ගැනීම සඳහා සැලකිය යුතු අන්දමේ නම්‍යශීලීතාවයක් මේ හරහා විද්‍යාඥයින්ට ලැබේ. සුපරීක්ෂණය සහ ඇගැයීම, ජාතික පර්යේෂණ සභාවෙහි කමිටු මණ්ඩලය ප්‍රමුඛ කාර්යාලය මගින් සිදු කෙරේ.

වත්මනදී ප්‍රදානය කෙරෙනු ලබන ප්‍රදානයන් ස්වභාවයෙන් විවිධාකාර වන බව මෙහිදී සඳහන් කළ යුතුය. මූලික විද්‍යාත්මක ප්‍රස්තුතයන්, ආහාර, ජලය, පරිසරය හා බලශක්ති යන ක්ෂේත්‍ර පිළිබඳව පර්යේෂණ මූල්‍යායනය කිරීමට අමතරව ජාතික පර්යේෂණ සභාව විසින් වාරිමාර්ග පද්ධතීන්, වනජීවී සහ පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය, කථන පරිවර්තනය, ඉදිකිරීම් සහ ගෘහ නිර්මාණ ශිල්පය, දුම්රිය ගමනාගමනය, ක්‍රීඩා සහ තවත් බොහෝමයක් ක්ෂේත්‍රයන්හී පර්යේෂණ ද මෑතක සිට මූල්‍යායනය කෙරේ.

සියලුම වැඩසටහන් සඳහා සරල සහ අංගසම්පූර්ණ අයදුම්පත්‍ර කට්ටලයක් පවතී. වසර තුළදී ජාතික පර්යේෂණ සභාව විසින් ලද අයදුම්පත්‍ර සංඛ්‍යාව ක්‍රමිකව වැඩිවීමක් පෙන්නුම් කර ඇති අතර මෙය ධනාත්මක සලකුණකි. මෙම වැඩසටහන හමුවේ ඇති අභියෝගය වනුයේ දැනටමත් ජාතික පර්යේෂණ සභාව විසින් අත් කරගනු ලැබ ඇති ගම්‍යතාවය එලෙසින් පවත්වාගෙන යාමයි

මෙම ප්‍රදානයන් වෙතින් උපරිම ප්‍රතිඵල ලබාගැනීමට හැකිවන අයුරින් මෙම ප්‍රදානයන්හි ප්‍රගතිය සුපරීක්ෂණය සහ ඇගැයීම සඳහා නව නීති රීති සහ මාර්ගෝපදේශනයන් විශාල සංඛ්‍යාවක් කමිටු මණ්ඩලය විසින් හඳුන්වා දෙනු ලැබිණි.

<u>**විද්‍යාත්මක ප්‍රකාශන වැඩසටහන සඳහා ජනාධිපති සම්මාන:**</u>

පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය කිරීමේ වැඩසටහන 2001 වසරේදී ආරම්භ කරනු ලැබූයේ ජාත්‍යන්තර තලය කරා ළඟාවූ විද්‍යාඥයින්ට බුහුමන් දැක්වීම, ජාතික විද්‍යාත්මක නිෂ්පාදනයන් ඉහළ නැංවීම සහ බුද්ධිගලනය වැළැක්වීම යන අභිමතාර්ථයන් පෙරදැරිවය. 1991 සිට මේ දක්වා විද්‍යාත්මක ප්‍රකාශන එළිදැක්වීම පිළිබඳ ජාතික සංඛ්‍යාලේඛන මගින් පෙන්වා දෙන්නේ ගුණාත්මක විද්‍යාත්මක ප්‍රකාශනවල සංඛ්‍යාවේ ඉහළ නැඟීමේ ප්‍රවනතාවයෙහි මූලාරම්භය විය හැකිය.

මෙම සම්පූර්ණ ක්‍රමවේදය පදනම්වී ඇත්තේ ප්‍රසාරිත විද්‍යා සඳහන් දර්ශකය මතය (SCIE). SCIE යනු, විද්‍යාව මත ඇති කෙරෙන බලපෑම සහ උසස් තත්ත්වය හා අදාලව ලෝකයේ ඉහළම තත්ත්වයෙහි ලා සැලකෙන විද්‍යාත්මක සඟරාවන්හී දත්ත ගබඩාවයි. මෙලෙස SCIE විසින් වර්ෂයකදී සඟරා 14000ක් පමණ විශ්ලේෂණයට ලක් කෙරේ.

සමාජ විද්‍යාව හැරුණුකොට අනෙකුත් සියළුම "සංකීර්ණ විද්‍යා" තේමාවන් පර්යේෂණ සම්මාන ප්‍රදාන යෝජනා ක්‍රමය මගින් ආවරණය කෙරෙන අතර ප්‍රසාරිත විද්‍යා සඳහන් දර්ශකයෙහි සලකා බැලෙන ප්‍රකාශන, ශ්‍රී ලාංකික කතුවරයෙකු දායක වූ ඒවා විය යුතුය.

2015 වසර තුළදී, එකී දර්ශකයෙහි ශ්‍රේණිගත සඟරාවන්හී පළවූ ප්‍රකාශනයන් සඳහා විද්‍යාඥයින් 295කට 2017 වසරේ පැවැත්වුණු උළෙලේදී සම්මාන පිරිනැමිණි.

## රාජ්‍ය පෞද්ගලික සහයෝගීතා වැඩසටහන:

ශ්‍රී ලංකාවේ අපේක්ෂිත ආර්ථික සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේදී අත්‍යාවශ්‍ය කොටසක් වන, ගෝලීය වෙළඳපළ තුළ තරඟකාරීත්වයෙන් යුතු, අගය එකතු කළ නිෂ්පාදන හා සේවාවන් වැඩිදියුණු කිරීමට විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධනයන් මහත් සේ ඉවහල් වනු ඇත. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා, ශ්‍රී ලංකාව තුළ සිදු කෙරෙන පර්යේෂණ, ආර්ථිකයේ ප්‍රගමනයට ඉවහල් වන, ප්‍රධාන කර්මාන්තයන්හී අවශ්‍යතාවන් සපුරාලන ඉල්ලීම් මත පදනම් වූ පර්යේෂණ විය යුතුය.

රාජ්‍ය-පෞද්ගලික දෙඅංශයේ සහයෝගීතා (PPP) වැඩසටහන මඟින්, රටෙහි ආර්ථික සංවර්ධනය කෙරෙහි දායකත්වයක් ලැබෙන පරිදි පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සහ කර්මාන්තයන්හී ප්‍රධාන හවුල්කරුවන් සම්බන්ධ කිරීම සිදුකෙරේ. විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධනයන් ප්‍රවර්ධනය තුලින් අපනයන ආදායම් ඉහළ නැංවීම, අපනයන භාණ්ඩ විවිධාංගීකරණය සහ ආනයන ආදේශක ප්‍රවර්ධනය යනාදිය හරහා ආර්ථික සංවර්ධනය ළඟාකර ගැනීමේ හැකියාව පවතී. නව්‍ය හෝ වඩා හොඳ තත්ත්වයේ නිෂ්පාදන, ක්‍රියාවලි, සේවාවන්, අගය එකතුකිරීම්, වාණිජමය හැකියාවන් සහිත තාක්ෂණික ගැටළු විසඳීම යනාදිය කෙරෙහි යොමුවූ නවෝත්පාදක පර්යේෂණයන් මෙම වැඩසටහන සඳහා සලකා බැලෙනු ඇත. විවිධ අංශයන් අතර ඇති කරගනු ලබන සහයෝගීතාවයන් තුලින් කර්මාන්තමය පර්යේෂණ සහ සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා විසඳුම් සොයාගනු පිණිස අපගේ පර්යේෂණ විශේෂඥතාවය, වියදම්, සේවාවන් සහ පහසුකම් වඩා ඵලදායී අයුරින් බෙදාහදා ගැනීමට හැකියාව ලැබේ. මෙම සහයෝගීතාවයන් හරහා රාජ්‍ය අංශයේ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම්හි කාර්යක්ෂමතාවය වැඩිදියුණු කෙරෙනු ඇති අතර ඒ සඳහා ගතවන කාලයද අවම වනු ඇත. රාජ්‍ය අංශයේ සහයෝගීතාවය සහිත ව්‍යාපාරයක් මඟින් දරනු ලැබූ පර්යේෂණ හා සංවර්ධන වියදම්වලට අදාලව බදු සහන ලබාදීම හරහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය දිරිගැන්වේ. ජාතික අවශ්‍යතාවයන් සඳහා පර්යේෂණ මත පදනම් වූ විසඳුම් ලබාදීම සඳහා ජාතික පර්යේෂණ සභාව විසින් රජය - දේශීය ආයතන - අමාත්‍යාංශ - විශ්වවිද්‍යාල - පර්යේෂණ හා සංවර්ධන ආයතන - පෞද්ගලික අංශය - කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රය යන අංශයන් අතර සම්බන්ධීකරණය සිදු කෙරේ.

## වෙනත් වැඩසටහන්:

සුහසාධන වැඩසටහන් - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ සෑම කාර්තුවකටම වරක් මහජනතාව වෙත පර්යේෂණ ප්‍රදානයන්හී ප්‍රතිලාභයන් ලබාදීමේ අරමුණින් සුහසාධන වැඩසටහනක් පවත්වන ලදී.

මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන් - තම පර්යේෂණයන් විද්‍යාඥයින් විසින් සමාලෝචනය කෙරෙනු ලබන සඟරාවන්හී පළකිරීම සඳහා ප්‍රදානලාභීන් දිරිගන්වනු ලැබේ. ඒ අතරම විද්‍යාඥයින් විසින් සිදු කරනු ලබන පර්යේෂණයන් පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම අරමුණු කරගනිමින් සිය සොයාගැනීම් පුවත්පත්වල පළකිරීම සඳහා විද්‍යාඥයින්ට පහසුකම් සලසා දීම ජාතික පර්යේෂණ සභාව විසින් සිදු කෙරේ.

## විශේෂ අවස්ථා - 2017

## ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන

ජාතික පර්යේෂණ සභාව විසින් 2017 ඔක්තෝම්බර් මසදී, 2018 වසර සඳහා නව ප්‍රදාන සඳහා අයැදුම්පත් කැඳවමින් දැන්වීම් පළ කරනු ලැබිණි.

| | 2014 | 2016 | 2018 |
|---|---|---|---|
| **ලැබූ අයැදුම්පත් සංඛ්‍යාව** | 60 | 50 | 25 |
| **විස්තරාත්මක යෝජනා සඳහා අවසන් කෙටි ලේඛනගත කරනු ලැබූ අයැදුම්පත් සංඛ්‍යාව** | 21 | 11 | 06 |
| **ඉදිරිපත් කිරීම් සඳහා අවසන් කෙටි ලේඛනගත කරනු ලැබූ අයැදුම්පත් සංඛ්‍යාව** | 11 | 06 | දැනට සිදුකෙරේ |
| **පිරිනමන ලද ප්‍රදානයන් සංඛ්‍යාව** | 05 | 03 | දැනට සිදුකෙරේ |

2014 සහ 2016 වර්ෂයන්හීදී පිරිනමන ලද ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ ප්‍රදානයන් 08ක් 2017 වසර තුළදී ක්‍රියාත්මකව පැවති අතර, ජාතික පර්යේෂණ සභාවේ ව්‍යාපෘති සුපරීක්ෂණ උපදේශක, මහාචාර්ය ආර්.බී. මාපා මහතා විසින් දෙවන වසරේ ප්‍රගතිය සුපරීක්ෂණය කරන ලදී.

දැනට ක්‍රියාත්මකව පවතින ඉලක්ක මත පදනම් වූ ප්‍රදාන**:**

- **වාහකයින් පාලනය භාවිතයෙන් ශ්‍රී ලංකාවේ ඩෙංගු පාලනය සඳහා මෙහෙයුම් ආකෘතියක්, ආරක්ෂක නිෂ්පාදන වැඩිදියුණු කිරීම සහ ප්‍රජාවන් ඒකරාශි කිරීම පිළිබඳ අංගසම්පූර්ණ පර්යේෂණ යෝජනාවක්** (ප්‍ර:අ: ආචාර්ය එම්. හපුගොඩ සහ නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය නිල්මිණී ගුණවර්ධන, කැළණිය විශ්වවිද්‍යාලය)

  මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, ස්වාභාවික අභිජනන වාසස්ථාන අවම කිරීම, නැනෝ තාක්ෂණය භාවිතයෙන් නිපදවූ කෘමිනාශක ගුණයෙන් යුතු ජනේල තිරරෙදි සහ මදුරු දැල් භාවිතයෙන් මදුරුවන් දෂ්ඨ කිරීම අවම කිරීම සහ ඩෙංගු පාලනය සඳහා ප්‍රජා සහභාගීත්වය වැඩිදියුණු කිරීම හරහා රසායන විද්‍යාත්මකව සහ ජෛව විද්‍යාත්මකව ඩෙංගු වාහකයින් පාලනය කිරීමයි.



- **ශ්‍රී ලංකාවේ සර්ප විෂ සඳහා බහුසංයුජතා ප්‍රතිවිෂ වර්ගයක් වැඩිදියුණු කිරීම**

(ප්‍ර:අ: මහාචාර්ය අයි.බී. ගවරම්මාන සහ නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය ඒ. දංගොල්ල, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

නවීන තාක්ෂණික සර්පාගාරයක් වැඩිදියුණු කිරීම හරහා ශ්‍රී ලංකාවේ, වෛද්‍ය විද්‍යාත්මක වැදගත්කමකින් යුත් සර්පයින්ගේ විෂ එක්රැස් කිරීම, විශ්ලේෂණය, ශ්‍රී ලංකාවේදී දෂ්ටනය සඳහා බහුසංයුජතා ප්‍රතිවිෂ වර්ගයක් වැඩිදියුණු කිරීම සහ ශ්‍රී ලංකාවේදී ප්‍රතිවිෂ නිෂ්පාදනය සඳහා අශ්වයින් යොදා ගැනෙන පර්යේෂණ සංකීර්ණයක් ස්ථාපනය කිරීම මෙහි අරමුණ වේ.




- **කිරි නිෂ්පාදනය අතින් ස්වයංපෝෂී තත්ත්වය ළඟාකර ගැනීම සඳහා කිරි කර්මාන්තය වැඩිදියුණු කිරීම**

(ප්‍ර:අ: කේ. මහීපාල මයා සහ නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය තුසිත් සමරකෝන්, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, පෝෂණ කළමනාකරණය වැඩිදියුණු කිරීම, වඩා හොඳ ආහාර සූත්‍ර භාවිතා කිරීම, පැටවුන් බිහි කිරීමේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම, උපරිම ගැබ් ගැනීමේ ශීඝ්‍රතාවයක් සඳහා සමමුහුර්තකරණ ක්‍රියාවලිය භාවිතය, දින 18-20 දී පූර්ව ගැබ් ගැනීම හඳුනාගැනීමේ අඩු වියදම් ක්ෂේත්‍ර කට්ටලයක් හඳුන්වා දීම, මැස්ටයිටීස් රෝගය සඳහා පොදු රෝග නිධාන හඳුනාගැනීම, රෝග හටගැනීම සහ ව්‍යාප්තිය අවම කිරීම සඳහා සුදුසු ප්‍රතිජීවක ඇසුරෙන් ප්‍රතිකාර කිරීම සහ සත්ත්ව සුභසාධනය වැඩිදියුණු කිරීම.



- **ශ්‍රී ලංකාවේ ව්‍යාප්තව පවතින රෝග නිධානය හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ අංගසම්පූර්ණ අධ්‍යයනයක්**

  (ප්‍ර:අ: මහාචාර්ය ආර්.එල්.ආර්. චන්ද්‍රජිත් සහ නියෝජ්‍ය ප්‍ර:අ: මහාචාර්ය ජේ.ජී.එස්. රණසිංහ, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

  මෙහි මුඛ්‍ය පරමාර්ථය වනුයේ, වත්මන සොයාගෙන නොමැති නිදන්ගත වකුගඩු රෝගයේ විවිධ ලක්ෂණ පිළිබඳ දැනුම සොයාගැනීමයි. රෝගයේ ක්‍රමික වර්ධනය සහ මරණයට පත්වීම සඳහා බලපාන සාධක හඳුනාගැනීම සඳහා නිදන්ගත වකුගඩු රෝගයෙන් පෙළෙන රෝගීන්ගෙන් ලබාගත් රුධිර සහ මුත්‍ර සාම්පල විශ්ලේෂණය කරනු ලැබේ. රෝගය ව්‍යාප්තව පවතින ප්‍රදේශයන් වන ගිරාඳුරුකෝට්ටේ සහ විල්ගමුව යන ප්‍රදේශයන්හී අංගසම්පූර්ණ හූ පරිසර අධ්‍යයනයක් සිදුකරනු ලැබූ අතර ළිං, වැව් සහ කුඹුරු ආදියෙන් ලබාගත් ජල සාම්පල ICPMS යන්ත්‍රය, භාවිතයෙන් බැර ලෝහ සඳහා විශ්ලේෂණය කරන ලදී. GIS අනුරූපනය භාවිතයෙන් මහවැලි ප්‍රදේශයන්හී පරිසර දූෂණය පිළිබඳ ඉතිහාසය සොයා බැලීම, මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සිදුකරන ලදී.



- **ශ්‍රී ලංකාව තුළ විවිධ දේශගුණ තත්ත්වයන්ට ගැළපෙන භෝග ප්‍රභේද සහ වගාකිරීමේ ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීම හරහා ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම**

  (ප්‍ර:අ: ආචාර්ය ඩබ්.එම්.ඩබ්. වීරකෝන් සහ නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය ඩී.එම්.ජේ.බී. සේනානායක, ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, මහඉලුප්පල්ලම)

  අධික උෂ්ණත්වයන්ට, පීඩාවන්ට ඔරොත්තු දෙන, වැඩි ඵලදාවක් සහිත පළිබෝධ සහ රෝග සඳහා ඔරොත්තු දෙන / ප්‍රතිරෝධී මිරිස්, බඩඉරිඟු, මුං බීජ සහ සහල් ප්‍රභේද වැඩිදියුණු කිරීම, විවිධ දේශගුණ තත්ත්වයන්ට යෝග්‍ය කෘෂිකාර්මික භාවිතයන් යෝජනා කිරීම; පාංශු තෙතමන දර්ශක භාවිතයෙන් නියඟයන්ට වඩාත් ලක්විය හැකි ප්‍රදේශ හඳුනාගැනීම සහ සිතියම්ගත කිරීම.



- **ප්‍රමාණවත් ඵලදාවක් පවත්වා ගනිමින් සහ පාංශු සාරවත්භාවය වර්ධනය කරගනිමින් අකාබනික පොහොර භාවිතය අවම කරනු පිණිස පරිසර හිතකාමී වගා තාක්ෂණයන් වැඩිදියුණු කිරීම**

  (ප්‍ර:අ: ආචාර්ය සමන් ධර්මකීර්ති, ආචාර්ය ඩබ්.එස්. දන්දෙනිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

  මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ, ශ්‍රී ලංකාවේ වී වගාවේදී රසායනික පොහොර භාවිත කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ ඒ හරහා රටෙහි රසායනික පොහොර භාවිතය අවම කරනු පිණිස පරිසර හිතකාමී සහ ගොවිජන හිතකාමී තාක්ෂණයන් වැඩිදියුණු කිරීමය. එමෙන්ම, ශාකවල මනා පැවැත්ම වැඩිදියුණු කරනු පිණිස සහ වී වගා බිමෙහි වෙනත් කෘෂි රසායනයන්හි භාවිතය අවම කරනු පිණිස මෙම තාක්ෂණයන්හි ඵලදායී යෙදවීම පිළිබඳ සොයාබැලීමද මේ හරහා අපේක්ෂිතය. මෙම වැඩිදියුණු කරන ලද තාක්ෂණයන්, පෞද්ගලික අංශයේ ආයෝජකයින් සමඟ ඇති කරගනු ලැබෙන සහයෝගීතාවයන් හරහා ගොවීන් වෙත හඳුන්වා දෙනු ඇත.



- **භූගත ජලයේ දියවී ඇති සමස්ත ඝන ද්‍රව්‍ය සහ ෆ්ලුවොරයිඩ් සඳහා ප්‍රතිකර්ම යෙදීමේ පහසුකමක ආකෘතියක් වැඩිදියුණු කිරීම - වියළි කලාපීය පානීය ජල ගැටලු සඳහා තිරසර විසඳුමක්**

  (ප්‍ර:අ: මහාචාර්ය රොහිත් වීරසූරිය, ආචාර්ය එස්.කේ. වේරගොඩ, ජාතික මූලික අධ්‍යයන ආයතනය)




වියළි කලාපයේ ජලයේ තත්ත්වය සම්බන්ධයෙන් පැනනැඟ ඇති ගැටලු සඳහා තිරසර විසඳුමක් ලබාදීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මේ යටතේ විද්‍යුත් ආතංචනය (electro-coagulation) සහ නිනිති පටල පෙරීමේ ක්‍රමය (nano membrane filtration) යොදා ගනිමින් ජලයේ අඩංගු අතිරික්ත ෆ්ලුවොරයිඩ් සහ සමස්ත දියවූ ඝන ද්‍රව්‍ය නියාමනය කිරීම සඳහා යෝග්‍ය තාක්ෂණය සහිත ජංගම ප්‍රතිකර්ම පහසුකමක් තැනීමට යෝජිතය. මෙම යෝජිත ජල ප්‍රතිකර්ම ආකෘතිය ආරම්භයේදී කුඩා ගම්මාන සඳහා සීමාවනු ඇත. ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ පාලනය යටතේ, මෙම පිරිසිදු ජලය, ජල ප්‍රභවය දර්ශනය වන මානයේ පදිංචි ග්‍රාමීය පාරිභෝගිකයන් වෙත ඔවුන්ගේ එදිනෙදා පරිභෝජනය සඳහා බෙදාහැරීම සිදුකෙරෙනු ඇත. ජල හිඟයෙන් පීඩා විඳින ජන ප්‍රජාවන්ගේ ගැටලු සඳහා කඩිනම් විසඳුමක් ලබාදීමේ අත්‍යාවශ්‍ය පළමු පියවරක් මේ හරහා තැබෙනු ඇත.

- **ජල පවිත්‍රීකරණය සඳහා උසස් ද්‍රව්‍ය මත පදනම් වූ පෙරහන් වැඩිදියුණු කිරීම**
  (ප්‍ර:අ: ආචාර්ය රෝහිණී ද සිල්වා, ආචාර්ය නලින් ද සිල්වා, කොළඹ විශ්වවිද්‍යාලය)

  ජල පවිත්‍රීකරණ ක්‍රියාවලිය සඳහා විදුලිය අවශ්‍ය නොවන, අඩු වියදම් සහ ඵලදායී ජල පෙරහනක්, ග්‍රාමීය ප්‍රජාව වෙත සපයාදීම මෙහි ප්‍රධාන අරමුණයි. මෙම තිරසර ජල පවිත්‍රීකරණ පද්ධතිය දේශීය නිෂ්පාදකයෙකු විසින් නිෂ්පාදනය කෙරෙනු ඇත. මෙහි නිර්මාණය කර ඇති බහුවිධ පද්ධතීන් විසින් බැක්ටීරියා, කාබනික දූෂක ද්‍රව්‍ය, බැරලෝහ සහ අනෙකුත් අකාබනික දූෂක ද්‍රව්‍ය ඉවත් කෙරෙනු ඇත.



# අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන

2017 වර්ෂය ආරම්භ වූයේ ජාතික පර්යේෂණ සභාවේ අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන සඳහා පුවත් පත් දැන්වීමක් පළකිරීම හරහා අයැදුම්පත් කැඳවීමෙනි. මෙම දැන්වීම සියළුම විශ්වවිද්‍යාල, පීඨයන් සහ සියළුම රජයේ පර්යේෂණ හා සංවර්ධන ආයතන අතර බෙදාහරින ලදී.

2017 ජනවාරි 31 දින අයැදුම්පත් භාරගැනීමේ කාලය නිමාවට පත් වූ අතර අයැදුම්පත් 105ක් ලැබී තිබුණි. පළමු කාර්තුව තුළදී දැනට ක්‍රියාත්මක ප්‍රදානයන්ගේ වාර්ෂික ප්‍රගති වාර්තාවන් ඇගැයීම් සඳහා යවන ලදී.

මෙම ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ දැනුමකින් යුතු ඇගැයීම්කරුවන් වෙත මෙම අයැදුම්පත් (2017) යවනු ලැබිණි. සාකච්ඡා මණ්ඩල හරහා, ජාතික පර්යේෂණ සභාව විසින් තවදුරටත් අයැදුම්පත් පරීක්ෂාවට ලක්කොට ඉහළ මට්ටමේ විද්‍යාත්මක කුසලතාවයක් සහ ජාතික අදාලත්වයක් පෙන්නුම් කෙරෙන අයැදුම්පත්, ප්‍රදානය සඳහා තෝරාගනු ලැබිණි.

| **ක්‍රියාකාරකම** | **2015** | **2016** | **2017** |
|---|---|---|---|
| **ඇගයීමෙන් පසු මූල්‍යනය සඳහා තෝරාගත් අයැදුම්පත් සංඛ්‍යාව** | 53 | 36 | 33 |
| **මූල්‍යනයකරනු ලැබූ ප්‍රදාන සංඛ්‍යාව** | 50+11* | 34 | 32 |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන හරහා පිරිනමනු ලැබූ ප්‍රදානයන්හී මුළු වටිනාකම | රු. මි. 218.0 | රු. මි. 107.6 | රු. මි. 128.7 |

* පූර්ව වර්ෂයේදී තෝරාගනු ලැබූ ප්‍රදානයන්

ඉදිරිපත් කරනු ලැබූ අයැදුම්පත් අතරින් 31% (33/105)ක් පමණක් තෝරාගනු ලැබිණි. තෝරාගනු ලැබූ අයැදුම්පත් මූල්‍යනය සඳහා මහාභාණ්ඩාගාරය වෙත යොමු කරන ලදී.

මෙමවර්ෂයතුළදී, 2017 වර්ෂයේදී ඉදිරිපත් කරනු ලැබූ අයැදුම්පත් ඇසුරෙන් පර්යේෂණ ප්‍රදාන 32ක් මූල්‍යයනය කරනු ලැබ, එම ප්‍රදානයන්හී කටයුතු ආරම්භ කෙරිණි.

වර්ෂය අවසානයේදී, ප්‍රදානයන් 16ක් සඳහා අවසාන ඇගැයීම් සම්පූර්ණ කරනු ලැබ තිබිණි.

මූල්‍යයනය කළ පර්යේෂණ ප්‍රදාන 2017

| Grant No. | Principal Investigator & Institution | Title |
|---|---|---|
| 17-006 | Prof. G. A. K. S. Perera<br>Wayamba University of Sri Lanka | Value addition to Sri Lankan natural rubber in the field of Power and Energy |
| 17-007 | Dr. R. T. De Silva<br>Sri Lanka Institute of Nanotechnology | Using Nano/micro-capsules for Self-healing Epoxy Composites |
| 17-008 | Dr. J. M. K. J. K. Premarathne<br>Wayamba University of Sri Lanka | Risk assessment of foodborne pathogens in food commodities available in the Sri Lankan market and application of biocontrol measures to ensure food safety |
| 17-010 | Prof. D. M. De Costa<br>University of Peradeniya | Analysis of pesticide residues and evaluation of some beneficial effects along with farmer perception of an eco-friendly crop management package for chili and tomato in comparison to existing commercial cultivation practices conducted in Sri Lanka |
| 17-011 | Dr. R. R. Ratnayake<br>National Institute of Fundamental Studies | Development of baseline soil information system for soil C and other nutrients for paddy growing soils in Sri Lanka |
| 17-017 | Prof. J. P. Eeswara<br>University of Peradeniya | Rapid multiplication and Production of Agarwood Fragrant Constituents by Plant Cell and Tissue Culture of *Gyrinopsis walla* |
| 17-018 | Dr. K. V. D. S. Chathuranga<br>University of Moratuwa | Design and Development of a Soft Orthotic Device for Lower Limb and Spinal Assistance |
| 17-019 | Dr. Chamindu Deepagoda<br>University of Peradeniya | Launching a Greenhouse Gas Emissions Technology Evaluation Center (GRETEC) |
| 17-020 | Prof. Kamani Tennekoon<br>Institute of Biochemistry Molecular Biology and Biotechnology (IBMBB) | Mutations and polymorphisms of mitochondrial genes as risk factors for sporadic breast cancer in Sri Lankan patients of Sinhalese ethnicity |
| 17-025 | Dr. A. M. C. P. K. Attanayake<br>University of Peradeniya | Baseline concentrations, solubility and spatial variability of potentially toxic trace elements in soils in Up- and Mid-country Wet zone in Sri Lanka |
| 17-027 | Prof. S. P. Benjamin<br>National Institute of Fundamental Studies | Taxonomic revisions of jumping spider subfamilies Ballinae and Spartaeinae of Sri Lanka based on morphology and DNA barcodes |
| 17-028 | Dr. D. M. U. A. K. Premarathne<br>University of Ruhuna | Igneous rocks in the Mannar Basin as potential evidence from Sri Lanka for the juxtaposition of the Reunion Hotspot and the impacts of the igneous rocks on the hydrocarbon exploration in the Mannar Basin |
| 17-029 | Dr. A. P. Attanayake<br>University of Ruhuna | Development of an antidiabetic agent from *Coccinia grandis* (L.) Voigt (Cucurbitaceae) for diabetes mellitus |

| | | |
|---|---|---|
| 17-033 | Dr. Susanthi Jayasinghe<br>University of Peradeniya | Combined therapeutic drug leads for antidiabetic and anti-hyperlipidaemic treatments from the selected combined medicinal plants |
| 17-037 | Prof. A. L. T. Hewawasam<br>University of Peradeniya | Investigation of Weathering and Erosional Processes in the Catchment of the Ma Oya Tributary of the Mahaweli River |
| 17-038 | Dr. D. D. C. Wanniarachchi<br>University of Sri Jayewardenepura | An automated system to quality control the fermentation stage in black tea manufacturing process |
| 17-042 | Dr. Ruwandi Ranasinghe<br>Institute of Biochemistry, Molecular Biology and Biotechnology (IBMBB) | Insight for molecular Anthropology of early people in Sri Lanka: Ancient human mtDNA and Molecular sex analysis of archeological skeletal remains at Udupiyangalge and Alugalge caves |
| 17-047 | Dr. H. D. Yapa<br>University of Peradeniya | Optimization of shear retrofilling of RC beams via non-linear numerical analysis |
| 17-054 | Prof. U. L. B. Jayasinghe<br>National Institute of Fundamental Studies | Bioactive metabolites of endophytic fungi from the medicinal plants *Coccinia grandis, Costus speciosus and Gymnema sylevestre* used in indigenous medicine for treatment of diabetes mellitus and possible commercial applications |
| 17-055 | Dr. Y. S. Wijayasinghe<br>University of Kelaniya | Molecular characterization of carbapenemase producing enterobacteria (CPE) isolated from a tertiary care teaching hospital in Sri Lanka & validation of a rapid CPE detection protocol |
| 17-058 | Dr. B. L. W. K. Balasooriya<br>Wayamba University of Sri Lanka | Temporal variation of cyanobacterial community in fertilized and long-term unfertilized tropical rice fields |
| 17-060 | Prof. W. K. Mampearachchi<br>University of Moratuwa | Adaptation of Mechanistic Pavement Design Guide for Road Designed based on Empirical Design Methods. |
| 17-064 | Dr. M. S. D. Fernando<br>University of Moratuwa | Improving effectiveness of Massive Open Online Courses (MOOCs) to meet the 21st century challenges |
| 17-065 | Dr. K. T. M. U. Hemapala<br>University of Moratuwa | Adaptive Protection of Microgrids Using Graph theory and Optimization algorithms |
| 17-066 | Dr. P. I. A. Gomes<br>Sri Lanka Institute of Information Technology | Ecological rehabilitation of canals in Colombo: a design to harmonize flood control and physical heterogeneity |
| 17-069 | Dr. A. G. Buddhika P. Jayasekara<br>University of Moratuwa | Intelligent wheelchair robot with human like interactive features for domestic environments |
| 17-072 | Dr. Susantha Siriwardana<br>Rubber Research Institute of Sri Lanka | Evaluation of structural, rheological and mechanical properties of ternary composites of filled Thermoplastics (TP) and Skim Natural Rubber (SNR) blends: a novel route for value addition to skim natural rubber |
| 17-074 | Dr. M. A. P. C. Piyathilaka<br>Wayamba University of Sri Lanka | Molecular phylogeny of marine macro algae (sea weeds) present in Sri Lankan coasts and isolation of anti-cancer compounds to target oral cancers from marine macro algae |

| | | |
|---|---|---|
| 17-086 | Dr. T. S. Palihawadana<br>University of Kelaniya | The steroid profile of follicular fluid in In Vitro Fertilization (IVF) treatment cycles with a standard controlled ovarian stimulation GnRH antagonist regimen and with adjuvant of Letrozole among women with polycystic ovary syndrome and non-PCOS, and its relationship with oocyte number, quality, fertilization rate and implantation rate |
| 17-094 | Dr. N. U. A. Jayasena<br>University of Peradeniya | Avian feathers as bio indicators of exposure to toxic trace elements and links between trophic position, genetic diversity and reproductive success |
| 17-095 | Dr. K. M. G. G. Jayasuriya<br>University of Peradeniya | Seed storage behaviour of fifty keystone rainforest species from Sri Lanka: Towards Conservation of Biodiversity |
| 17-098 | Prof. Shiroma Handunnetti<br>Institute of Biochemistry, Molecular Biology and Biotechnology (IBMBB) | Detection of genotypes and serotypes of Leptospira isolated from severe leptospirosis patients |

# විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය

දස වන වරට පවත්වනු ලැබූ විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානෝත්සවය කොළඹ, ටාජ් සමුද්‍ර හෝටලයේදී, 2017 නොවැම්බර් 06 දින පවත්වන ලදී.

ප්‍රසාරිත විද්‍යා සඳහන් දර්ශනයේ ශ්‍රේණිගත සඟරාවල, ප්‍රකාශන පළකල විද්‍යාඥයින් 295දෙනෙකු සඳහා (2015 වසරට අදාළව) සම්මාන පිරිනමන ලදී. 2015 වසර තුලදී වෛද්‍ය විද්‍යාව, කෘෂිකර්මය සහ ඉංජිනේරු විද්‍යාව ඇතුළත් විෂයයන් පිළිබඳ පළවූ ප්‍රකාශන 500කට අධික සංඛ්‍යාවක් සඳහා සම්මාන පිරිනැමිණි.

මෙම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහභාගී වූ අතර විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ ගරු රාජ්‍ය අමාත්‍ය ලක්ෂමන් සෙනෙවිරත්න මැතිතුමා සහ අමාත්‍යාංශ ලේකම් උදය සෙනෙවිරත්න මැතිතුමන් ද ගෞරවණීය ආරාධිතයින් ලෙස සහභාගී වූහ. තවද, පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හී, විශ්වවිද්‍යාලයන්හී සම්භාවනීය ආරාධිතයින්ද, සම්මාන ලැබූවන්ද මෙම අවස්ථාව සඳහා සහභාගී වූහ.

ජාතික පර්යේෂණ සභාව විසින් ජනාධිපති ලේකම් කාර්යාලය සහ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් මෙම උළෙල සංවිධානය කරන ලදී.







for Scientific Publication


President's Awards for Scientific






Publication




President's Awards for Scientific
විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය
விஞ்ஞான, தொழில்நுட்பவியல் மற்றும் ஆராய்ச்சி அமைச்சு
Ministry of Science, Technology and Research
Council



# රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා වැඩසටහන

මෙම කාලසීමාව තුලදී රාජ්‍ය පෞද්ගලික සහයෝගීතා වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි.

| ක්‍රියාකාරකම් | 2015 | 2016 | 2017 |
|---|---|---|---|
| රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතාවය සඳහා ලද EOI සංඛ්‍යාව | 6 | 12 | 10 |
| විස්තරාත්මක යෝජනාවන් ඉදිරිපත් කිරීම සඳහා තෝරාගත් EOI සංඛ්‍යාව | 4 | 9 | 4 |
| පෞද්ගලික අංශය සමඟ පහසුකම් සපයාගත යුතු සහයෝගීතාවයන් සංඛ්‍යාව | 1 | 3 | 2 |
| අවශ්‍ය මුළු මුදල | රු. මි.12.27 | රු. මි.56.687 | රු. මි.6.84 |
| පෞද්ගලික අංශය මඟින් සපයනු ලැබූ මුදල (දළ වශයෙන් 50%) | රු. මි.6.17 | රු. මි.28.343 | රු. මි.3.42 |

**දැනට ක්‍රියාත්මක රාජ්‍ය පෞද්ගලික සහයෝගීතාවයන්...**

| පර්යේෂණ සහකරු | ව්‍යාපෘති නාමය |
|---|---|
| ආචාර්ය එස්.එම්.සී.යූ.පී. සුබසිංහ<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | Variation of naturally and artificially induced agarwood resin content and quality of *Gyrinops walla* for commercial extraction and its nursery establishment |
| මහාචාර්ය සරෝජ් ජයසිංහ<br>කොළඹ විශ්වවිද්‍යාලය | Investigation into the effect of drinking and cooking water with reduced fluoride content and hardness, on the prevalence, incidence and severity of chronic kidney diseases of uncertain aetiology (CKDu) in a selected G.N. Division in Vavuniya District |
| ආචාර්ය ශාන්ත වල්පලගේ<br>මොරටුව විශ්වවිද්‍යාලය | Development of a material using natural rubber and polyethylene as a substitute to conventional roofing sheets |
| ජී.එල්.සී. ගලහිටියාව මහතා<br>තේ පර්යේෂණ ආයතනය | Development of Self-Cleaning Sifter with multiple mesh frames for grading long leafy & wiry type tea |
| ආචාර්ය අනිල් ගුණතිලක<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | Locally Developed Sustained Release Tablets |

| පර්යේෂණ සහකරු | ව්‍යාපෘති නාමය |
|---|---|
| ආර්.එම්. ධර්මදාස මහතා<br>කාර්මික තාක්ෂණ ආයතනය | Extraction and formulation of plant protection products from endemic plants for healthy growth of crops free from sucking insects(mealybugs, aphids, whiteflies and thrips) causing yellowing, wilting and leaf-curl |
| ආචාර්ය එන්.එම්.එස්. සිරිමුතු<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | Nanomaterials for improved electrical conductivity of natural rubber compound for non-marking solid tires |
| මහාචාර්ය එන්.කේ.බී. අදිකාරම්<br>ජාතික මූලික අධ්‍යයන ආයතනය | Study of a postharvest disease and disorders adversely affecting the export potential of mango var. TomEJC and their management |

# වෙනත් වැඩසටහන්

මෙම කාලසීමාව තුළ එක් සුහසාධන වැඩසටහනක් පවත්වන ලදී.

| | |
|---|---|
| පළමු සුහසාධන වැඩසටහන 2017<br>ජා:ප:ස: ප්‍රදාන අංක: 11-056 | **“ජෛව පටල ජෛව පොහොර වඩා හරිත ශ්‍රී ලංකාවක් උදෙසා (නුවරඑළිය ප්‍රදේශයේ එළවළු වගාව පිළිබඳ විශේෂිත අවධානය යොමුකරමින්)”** |
| | **සම්පත් දායකයින්:** ආචාර්ය ගාමිණී සෙනෙවිරත්න (ජා:ප:ස: ප්‍රදාන අංක: 11-056, ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS) සහ ඉංජිනේරු සමුදිත කුමාරසිංහ, අධ්‍යක්ෂ මෙහෙයුම්, සී/ස ලංකා බයෝ ෆර්ටිලයිසර්ස් (පෞද්.) සමාගම |
| | **ඉලක්කගත ප්‍රතිලාභීන්:** නුවරඑළිය, සීතාඑළිය සහ කඳපොළ ප්‍රදේශයන්හී ගොවීන් සහ කෘෂිකර්ම නිලධාරීන් |



| | |
|---|---|
| **පොලිතීන්හි තිරසර කළමනාකරණය** | අපගේ 2017 වසර සඳහා වන සුහසාධන වැඩසටහනෙහි එක් කොටසක් ලෙස, ජාතික පර්යේෂණ සභාව විසින්, ජනාධිපති ලේකම් කාර්යාලය, විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය, තිරසර සංවර්ධන සහ වනජීවී අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරිය හා එක්ව පොලිතීන්හි තිරසර කළමනාකරණය සඳහා වැඩසටහනක් දියත් කෙරෙනු ඇත. |
| | **සම්පත් දායකයින්:** එච්.එම්.පී. බණ්ඩාර මහතා, ප්‍රධාන ලේකම්, උතුරු මැද පළාත, මහාචාර්ය ජනක ද සිල්වා, සභාපති, ජාතික පර්යේෂණ සභාව, කේ.එච්. මුතුකුඩආරච්චි මහතා, අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය, ආචාර්ය විමල් විමලදාස, ව්‍යාපෘති අධ්‍යක්ෂ, Re-resource ව්‍යාපෘතිය, ඊ.එම්.එන්.ඩබ්. ඒකනායක මිය, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, උතුරු මැද පළාත සහ එම්. කොඩිප්පිලි ආරච්චි මෙය, පළාත් පාලන කොමසාරිස්, උතුරු මැද පළාත |

| | |
|---|---|
| | **ඉලක්කගත ප්‍රතිලාභීන්:** උතුරු මැද පළාතේ පළාත් සභාවේ නිලධාරීන් 120ක් |





| | |
|---|---|
| අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ (TOT) වැඩසටහන | ජාතික පර්යේෂණ සභාව විසින් උතුරු මැද පළාතේ ගුරු උපදේශකවරුන් සහ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන් දෙකක් සංවිධානය කරන ලදී. |
| | **සම්පත් දායකයින්:**<br>මහාචාර්ය සරත් කොටගම, මහාචාර්ය ජගත් ප්‍රේමචන්ද්‍ර<br>ආචාර්ය වරුණ ගුණතිලක, බන්දුල සරත් කුමාර මයා |
| | **ඉලක්කගත ප්‍රතිලාභීන්:** ගුරු උපදේශකවරුන් සහ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් |







| | |
|---|---|
| පොළොන්නරුව දිස්ත්‍රික්කය සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ (TOT) වැඩසටහන | ජාතික පර්යේෂණ සභාව විසින් උතුරු මැද පළාතේ ගුරු උපදේශකවරුන් සහ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන් දෙකක් සංවිධානය කරන ලදී. |
| | **සම්පත් දායකයින් :** මහාචාර්ය සරත් කොටගම, මහාචාර්ය අජිත් ද අල්විස්, මහාචාර්ය අනුජ ප්‍රේමවර්ධන, ආචාර්ය විමල් විමලදාස, මහාචාර්ය ජනක ද සිල්වා |
| | **ඉලක්කගත ප්‍රතිලාභීන් :** ගුරු උපදේශකවරුන් සහ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් |






| | |
|---|---|
| ස්වාධීන රූපවාහිනී මාධ්‍ය වැඩසටහන | **හිඟුරක්ගොඩ ආනන්ද බාලිකා විද්‍යාලයේ පැවැති ස්වාධීන රූපවාහිනී "මාධ්‍ය ප්‍රදීප" වැඩසටහන සමඟ ජාතික පර්යේෂණ සභාව එක්වේ.** |
| | **සම්පත් දායකයින්** : ආචාර්ය හසන්ත හෙට්ටිආරච්චි / ජාතික රූපවාහිනී ජාලය, ප්‍රධාන විධායක නිලධාරී, වන්දන තිලකරත්න මහතා |
| | **ඉලක්කගත ප්‍රතිලාභීන් :** පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පාසැල් සිසුන් 850ක් |




<table>
<tr><td rowspan="3">දිඹුලාගල අධ්‍යාපන කලාපය සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ (TOT) වැඩසටහන</td><td>ජාතික පර්යේෂණ සභාව විසින් දිඹුලාගල අධ්‍යාපන කලාපයේ ගුරුවරුන් සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී.</td></tr>
<tr><td>සම්පත් දායකයින් : සම්පත් නෝනිස් මහතා, නදීකා දිසානායක මෙය</td></tr>
<tr><td>ඉලක්කගත ප්‍රතිලාභීන් : දිඹුලාගල අධ්‍යාපන කලාපයේ ගුරුවරුන් 50දෙනෙක්</td></tr>
</table>









# වාර්ෂික ගිණුම් - 2017

# විගණකාධිපතිගේ වාර්තාව

# සම්බන්ධවිය හැකි අයුරු පිළිබඳ තොරතුරු


**ජාතික පර්යේෂණ සභාව**

**120/7, විද්‍යා මාවත, කොළඹ 07.**

| | | | | | |
|---|---|---|---|---|---|
| **පොදු දුරකථන** | **:** | **011-2675176** | **ෆැක්ස්** | **:** | **011-2675136** |
| **ඊ-මේල්** | **:** | admin@nrc.gov.lk | **වෙබ් අඩවිය** | **:** | www.nrc.gov.lk |

# වාර්ෂික ගිණුම් ප්‍රකාශන - 2017

## ජාතික පර්යේෂණ සභාව

**2018 පෙබරවාරි 08**

ජාතික පර්යේෂණ සභාව
120/07, විද්‍යා මාවත, කොළඹ 07
වෙබ් ලිපිනය: www.nrc.gov.lk ඊ-මේල්: nrc@sltnet.lk

# 2017 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන

*මූල්‍යමය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය*

*මූල්‍යමය කාර්යසාධන ප්‍රකාශනය*

*මුදල් ප්‍රවාහ ප්‍රකාශය*

*ශුද්ධ වත්කම්/ හිමිකම වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය*

*මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්*

## ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව
## 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍යමය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන් | 2017<br>රු. | 2016<br>(නැවත ප්‍රකාශිත)<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | | 33,704,772.25 | 29,549,046.18 |
| විශේෂ අත්තිකාරම් | | - | 178,500.00 |
| ඉලක්කගත බහුවිෂයානුබද්ධ ප්‍රදාන වැඩසටහන | 1 | 219,639,605.12 | 220,027,094.40 |
| ජා:ප:ස: ප්‍රදාන | 1 | 269,097,441.61 | 289,141,670.91 |
| ජා:ප:ස: රාජ්‍ය, පෞද්ගලික සහයෝගීතා වැඩසටහන | 1 | 33,593,592.26 | 35,687,146.05 |
| වෙනත් ජංගම වත්කම් | | | |
| | | **556,035,411.24** | **574,583,457.54** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| වෙනත් මූල්‍ය වත්කම් | 2 | 1,971,000.00 | 1,971,000.00 |
| දේපළ, පිරියත හා උපකරණ | 3 | 297,079,066.65 | 281,483,722.71 |
| | | **299,050,066.65** | **283,454,722.71** |
| **මුළු වත්කම්** | | **855,085,477.89** | **858,038,180.25** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු දෑ | 4 | 609,881.78 | 372,759.95 |
| | | 609,881.78 | 372,759.95 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | | 343,145.00 | 242,185.00 |
| | | 343,145.00 | 242,185.00 |
| **මුළු වගකීම්** | | 953,026.78 | 614,944.95 |
| **ශුද්ධ වත්කම්** | | **854,132,451.11** | **857,423,235.30** |
| **ශුද්ධ වත්කම්/ ස්කන්ධය** | | | |
| ප්‍රාග්ධනය සඳහා දායකත්වය; | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන | | 802,186,494.40 | 806,562,010.26 |
| සංචිත | | | |
| සමුච්චිත අතිරික්තය/ (හිඟය) | | 51,945,956.71 | 50,861,225.04 |
| සුළු කොටස් අයිතිය | | | |
| **මුළු ශුද්ධ වත්කම්/ ස්කන්ධය** | | 854,132,451.11 | **857,423,235.30** |

**පිටු අංක 06 සිට 11 දක්වා සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක 12 සිට 19 දක්වා සඳහන් කර ඇති සටහන් සඳහා මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි ප්‍රධාන කොටසක් ඇතුලත් වේ. මෙම මූල්‍ය ප්‍රකාශය සැකසීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම සභාව සතුවේ. මෙම මූල්‍ය ප්‍රකාශය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත පරිදි අත්සන් තැබේ.**

| | | | |
|---|---|---|---|
| මහාචාර්ය එච්.ජේ. ද සිල්වා | ටී.ඒ. රත්නසීල | එම්.සී. රාජපක්ෂ | එම්.ජී.ආර්.එන්. සමන්කුමාරි |
| සභාපති/ ජාතික පර්යේෂණ සභාව | සභාවෙහි කමිටු සාමාජික | විධායක ලේකම් | ගණකාධිකාරී |

**ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව**

**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍යමය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන් | 2017 රු. | 2016 (නැවත ප්‍රකාශිත) රු. |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| පුනරාවර්තන ලැබීම් - ජා:ප:ස: පරිපාලනය | *5* | 20,981,436.00 | 16,679,325.00 |
| මූලධන ප්‍රදාන | | 1,378,411.25 | 927,914.07 |
| පුනරාවර්තන ලැබීම් - පර්යේෂණ හා සංවර්ධන | *6* | 181,404,230.42 | 183,220,198.13 |
| වෙනත් ලැබීම් | | 1,424,599.24 | 1,590,522.25 |
| හුවමාරුවෙන් ලද මුදල් - ජා:ප:ස: | | 133,526.19 | 759,634.55 |
| නිවෙස් කුලී පියවීම | | | 707,516.00 |
| **මුළු ආදායම** | | **205,322,203.10** | **203,885,110.00** |
| **වියදම්** | | | |
| පුද්ගල වේතන | | 8,507,396.03 | 9,000,840.96 |
| පර්යේෂණ හා සංවර්ධන | *7* | 135,594,587.30 | 142,530,222.32 |
| සැපයුම් සහ පරිභෝජන | *8* | 11,238,737.54 | 7,751,332.33 |
| ක්ෂය වියදම් - ජා:ප:ස: ප්‍රදාන | | 45,809,643.12 | 40,689,975.81 |
| ක්ෂය - ජා:ප:ස: කාර්යාල උපකරණ | | 1,378,411.25 | 927,914.07 |
| වෙනත් වියදම් | | 1,558,920.00 | 1,637,200.00 |
| මූල්‍ය පිරිවැය | | 16,250.00 | 16,250.00 |
| හුවමාරුවෙන් ලද මුදල් - ජා:ප:ස: | | 133,526.19 | 759,634.55 |
| **මුළු වියදම්** | | **204,237,471.43** | **203,313,370.04** |
| අතිරික්තයෙන් ආශ්‍රිතයන් සඳහා වෙන්කරන කොටස | | | |
| **කාලච්ඡේදයේ අතිරික්තය/ (හිඟය)** | | 1,084,731.67 | **571,739.96** |
| වෙන් කළා**:** | | | |
| පාලන අස්තිත්වයේ හිමිකාරත්වයට | | 1,084,731.67 | **571,739.96** |
| සුළු කොටස්කරුවන් | | | |
| | | 1,084,731.67 | **571,739.96** |

*පිටු අංක **06** සිට **19** දක්වා ඇති සටහන්ද මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේම කොටසකි.*
*වරහන් මඟින් අඩුවීම් දක්වා ඇත.*

**ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව**

**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සටහන් | 2017<br>රු. | 2016<br>(නැවත ප්‍රකාශිත)<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වන මුදල් ප්‍රවාහය** | | | |
| **ලැබීම්** | | | |
| බදු | | | |
| මහා භාණ්ඩාගාරයෙන් ලැබීම් (පුනරාවර්තන) | | 20,981,436.00 | 16,679,325.00 |
| මහා භාණ්ඩාගාරයෙන් ලැබීම් (සංවර්ධන ආධාර) | | 178,540,652.00 | 230,000,003.00 |
| භාණ්ඩ හා සේවා අලෙවියෙන් | | | |
| නිම කළ ප්‍රදානයන්ගෙන් ලැබීම් | | 23,874,574.56 | 28,984,225.21 |
| පොලී ලැබීම් | | | |
| වෙනත් ලැබීම් | | 1,389,125.00 | 1,592,792.52 |
| **ගෙවීම්** | | | |
| සේවකයන් සඳහා මුදල් ගෙවීම | | (9,974,356.03) | (10,577,070.96) |
| විශ්‍රාම පාරිතෝෂික | | | |
| සැපයුම් | | | |
| පර්යේෂණ ප්‍රදාන හා වෙනත් වැඩසටහන් | *9* | ( 190,841,467.00 ) | (251,527,781.17) |
| පොලී ගෙවීම් | | | |
| වෙනත් ගෙවීම් | | (15,994,526.18) | (12,067,700.31) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **7,975,438.35** | **3,083,793.29** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහය** | | | |
| පරියත හා උපකරණ මිලදී ගැනීම | | (3,998,212.28) | -5,999,882.75 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(3,998,212.28)** | **-5,999,882.75** |
| **මුදල් හා මුදල් සමාන දෑහී ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)** | | 3,977,226.07 | -2,916,089.46 |
| **කාලච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | | 29,727,546.18 | 32,643,635.64 |
| **කාලච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | | **33,704,772.25** | **29,727,546.18** |

***පිටු අංක 06 සිට 19 දක්වා ඇති සටහන්ද මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේම කොටසකි.***

***වරහන් මගින් අඩුවීම් දක්වා ඇත.***

**ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව**

## 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | නැවත ප්‍රකාශිත සමුච්චිත අතිරික්තය හෝ හිඟය<br>රු. | ප්‍රාග්ධන ප්‍රදාන නැවත ප්‍රකාශිත<br>රු. | මුළු ශුද්ධ වත්කම් / හිමිකම්<br>රු. |
|---|---|---|---|
| **2016.01.01 දිනට ශේෂය** | **50,997,001.08** | **761,481,100.44** | **812,478,101.52** |
| ආදායම ගැලපීම් ලෙස කුලී සහ කුලී තැන්පතු පැවරීම | (707,516.00) | | (707,516.00) |
| ප්‍රදාන 13-108 | | (11,347.50) | (11,347.50) |
| 2016 වර්ෂය තුළ ලද ප්‍රාග්ධන ප්‍රදාන | - | 230,000,003.00 | 230,000,003.00 |
| 2016 වර්ෂය සඳහා ආදායම් ලෙස හඳුනාගත් ප්‍රාග්ධන ප්‍රදාන | - | (120,787,705.56) | (120,787,705.56) |
| ප්‍රාග්ධන වත්කම්හී ක්ෂයවීම සහ අපහරණ පාඩු | - | (64,120,041.17) | (64,120,041.17) |
| | 50,289,485.08 | 806,562,009.19 | 856,851,495.34 |
| | 50,289,485.08 | 806,562,009.19 | 856,851,495. 34 |
| | | | - |
| 2016 වර්ෂය සඳහා අතිරික්තය/ (හිඟය) | **571,739.96** | **-** | **571,739.96** |
| | | | - |
| **2016.12.31 දිනට ශේෂය** | **50,861,225.04** | **806,562,010.26** | **857,423,235.30** |
| **2017.01.01 දිනට ශේෂය** | **50,861,225.04** | **806,562,010.26** | **857,423,235.30** |
| 2017 වර්ෂය තුළ ලද ප්‍රාග්ධන ප්‍රදාන | | 178,540,652.00 | 178,540,652.00 |
| 2017 වර්ෂය සඳහා ආදායම් ලෙස හඳුනාගත් ප්‍රාග්ධන ප්‍රදාන | - | (120,856,628.86) | (120,856,628.86) |
| ප්‍රාග්ධන වත්කම්හී ක්ෂයවීම සහ අපහරණ පාඩු | - | (62,059,539.00) | (62,059,539.00) |
| | 50,861,225.04 | 802,186,494.40 | 853,047,719.44 |
| | 50,861,225.04 | 802,186,494.40 | 853,047,719.44 |
| | | | - |
| 2017 වර්ෂය සඳහා අතිරික්තය/ (හිඟය) | **1,084,731.67** | **-** | **1,084,731.67** |
| **2017.12.31 දිනට ශේෂය** | **51,945,956.71** | **802,186,494.40** | **854,132,451.11** |

*පිටු අංක 06 සිට 19 දක්වා ඇති සටහන්ද මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේම කොටසකි. වරහන් මඟින් අඩුවීම් දක්වා ඇත.*

**ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව**
**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

## 1. සංයුක්ත තොරතුරු

### 1.1 පොදු

අංක 1514/28 **දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ** 33 **වන වගන්තිය යටතේ ජනාධිපති නියෝගයක් මත විශේෂ ආයතනයක් ලෙස පිහිටුවනු ලැබූ ජාතික පර්යේෂණ සභාව, 2016 ජුලි 29 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පළකරනු** ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් 2016 අංක 11 දරණ පනත හරහා ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව ලෙස ස්ථාපනය කෙරිණි.

ජාතික පර්යේෂණ සභාව, අංක 120/7, විද්‍යා මාවත, කොළඹ 07 යන ස්ථානයේ පිහිටා ඇති රාජ්‍ය ආයතනයකි.

මූල්‍ය ප්‍රකාශන දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයකට සකස්කොට ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්හී ස්වභාවය

අංක 1514/28 **දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ** 33 **වන වගන්තිය යටතේ ජනාධිපතිතුමන් විසින් නිකුත් කරනු ලැබූ නියෝගයක් මත දක්වා ඇති ජාතික පර්යේෂණ සභාවේ කාර්යයන්,** 2016 ජුලි 29 දිනැති ගැසට් පත්‍රයෙහි පළකරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් 2016 අංක 11 දරණ පනත හරහා ප්‍රතිසංස්කරණයට ලක්විණි. සඳහන් කර ඇති අරමුණු සපුරා ගැනීම සඳහා පහත දැක්වෙන ප්‍රධාන වැඩසටහන් මෙම වසර තුළදී ක්‍රියාත්මක කරන ලදී.

***පර්යේෂණ ප්‍රදාන සහ ආචාර්ය උපාධි වැඩසටහන***

- රාජ්‍ය අංශයේ පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හී පර්යේෂණයන් සහ පශ්චාත් උපාධි අධිශිෂ්‍යත්ව මූල්‍යනය කිරීම. මෙම වර්ෂය තුලදී මෙම වැඩසටහන “අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන” ලෙස එක් වැඩසටහනක් ලෙස ඒකාබද්ධ කෙරිණි.

***විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන***

- ශ්‍රී ලාංකීය පර්යේෂකයින් සහ පර්යේෂණ ආයතන සඳහා පිළිගැනීමක් ලබාදීම.

මෙම වසර තුලදී මෙම වැඩසටහනෙහි නාමය “විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන” ලෙස වෙනස් කරණු ලැබිණි.

***පෞද්ගලික රාජ්‍ය සහයෝගීතා වැඩසටහන***

- ඒකාබද්ධ ප්‍රවේශයක් හරහා පෞද්ගලික / රාජ්‍ය අංශයේ පර්යේෂණ අවශ්‍යතාවයන් මූල්‍යනය කිරීම.

පෞද්ගලික අංශයේ සහයෝගීතා වැඩසටහන හරහා පෞද්ගලික අංශයේ ආයෝජන සිදු කෙරෙන අතර මෙම වර්ෂය තුල රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා ව්‍යාපෘති 8ක් ක්‍රියාත්මකව පැවැත්විණි. ඒ අනුව, 2017 දෙසැම්බර් 31 දිනට මෙම පෞද්ගලික සහයෝගීතා ගිණුම්හී ශේෂයන් රු.11,782,215.49ක් විය.

***වෙනත් සංවර්ධන වැඩසටහන්***

- ජාතික පර්යේෂණ සභාවෙහි අරමුණු සපුරා ගැනීම සඳහා අවශ්‍ය වෙනත් වැඩසටහන්

***ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ සුවිශාල ව්‍යාපෘති වැඩසටහන***

සිය මූල්‍යයන ප්‍රතිපත්තීන් සංශෝධනය කිරීමට**,** ජාතික පර්යේෂණ සභාව ක්‍රියාකොට ඇති අතර ඒ යටතේ ඉලක්ක මත පදනම් වූ පර්යේෂණ ව්‍යාපෘතීන් මූල්‍යනය කිරීම සඳහා 2014 වසරේ සිට ප්‍රමුඛත්වය හිමිවනු ඇත. සෑම වර්ෂයකම**,** රාජ්‍ය විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හී සහ විශ්වවිද්‍යාලයන්හී පර්යේෂණ කණ්ඩායම් වෙතින්**,** රටෙහි ආර්ථික සංවර්ධනය, සමාජීය සුභසාධනය සහ පාරිසරික තිරසරභාවය අරමුණු කරගනිමින් ජාතික ගැටළු විසඳීම කෙරෙහි යොමු වූ ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ව්‍යාපෘතීන් මූල්‍යයනය කිරීම සඳහා පූර්ව යෝජනා කැඳවනු ලැබේ. වසර 5ක කාලසීමාවක් තුල පිරිනැමෙන මෙම එක් ප්‍රදානයක වටිනාකම රු. මිලියන 50ක් දක්වා වනු ඇත. ජාතික විද්‍යා තාක්ෂණ ප්‍රතිපත්ති වාර්තාව හා අනුකූලත්වය දක්වමින් ප්‍රමුඛතා ක්ෂේත්‍ර කිහිපයක් වෙතින් යෝජනා කැඳවනු ඇත.

### 1.2 නිකුත් කිරීම සඳහා අවසරය ලබාදෙන දිනය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජාතික පර්යේෂණ සභාවෙහි මූල්‍ය ප්‍රකාශනයන් නිකුත් කිරීම සඳහා සභාවේ කමිටු සාමාජිකයන්ගේ අවසරය 2018.02.16 දින ලබාදෙන ලදී.

### 2. ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

### 2.1 සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් (SLPSAS) හා අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස්කොට ඇත.

### 2.1.1 අනුකූලතා ප්‍රකාශය

ජාතික පර්යේෂණ සභාවෙහි මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත්කොට ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් (SLPSAS) හා අනුකූලව පිළියෙල කොට ඇත.

### 2.1.2 සැලකිලිමත්භාවය

ජාතික පර්යේෂණ සභාවට සිය ක්‍රියාකාරකම්හී අඛණ්ඩව නියැලීම සඳහා සම්පත් තිබීම පිළිබඳව ජාතික පර්යේෂණ සභාවේ කමිටු සාමාජිකයන් සෑහීමකට පත්වී ඇත. තවද, ද්‍රව්‍යමය අවිනිශ්චිතතාවයක් පිළිබඳව සභාවේ කමිටු සාමාජිකයන් දැනුවත් වී නොමැත.

### 2.1.3 මැනීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමට පිළිගත් ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව සකස්කර ඇති අතර මෙම ගිණුම් සඳහා බලපාන උද්ධමන සාධකයක් සඳහා කිසිදු ගැලපීමක් කර නැත.

### 2.1.4 මෙහෙයුම් හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ රුපියල් වලින් ඉදිරිපත් කරන අතර ජාතික පර්යේෂණ සභාවෙහි මෙහෙයුම් මුදල් ඒකකයද එය වේ.

සියලුම මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකාවේ රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර වෙනත් ලෙසකින් දක්වා නොමැත්තේ නම් ආසන්න සතයට දක්වනු ලැබේ.

### 2.4 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්

මූල්‍යමය තත්වය පිළිබඳ ප්‍රකාශනයන්හී නියෝජනය වී ඇති යම් යම් ධාරණ අගයන් මැනීමේදී සිදුකළ උපකල්පනයන් සහ ඇස්තමේන්තු සහ මූල්‍යමය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයෙහි ගාස්තු ප්‍රමාණයන් අනුව මූල්‍යමය ප්‍රකාශනයන් විවල්‍ය වේ. මූල්‍යමය ප්‍රකාශන සටහන්හී හෙළිකොට ඇති වත්කම් සහ බැරකම්හී ධාරණ අගයන් සඳහා ප්‍රමාණාත්මක ගැලපීම් සිදුවීමේ සැලකිය යුතු අන්දමේ අවදානමක් මෙමඟින් ප්‍රතිඵල වනු ඇත.

SLPSAS ප්‍රමිතීන් හා අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම සහ වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් ලෙස වාර්තා කළ අගයන්ට බලපාන විවිධ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනය කිරීම සඳහා කළමනාකරණයන් අවශ්‍ය වේ. විනිශ්චයන් සහ ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ ඓතිහාසික අත්දැකීම් සහ යම් යම් තත්ත්වයන් මත සාධාරණ යැයි විශ්වාස කෙරෙන අපේක්ෂාවන් ද ඇතුළත් වූ වෙනත් සාධක මතය. එබැවින්, සත්‍ය අත්දැකීම් සහ ප්‍රතිඵලයන් මෙම විනිශ්චයන් සහ ඇස්තමේන්තු වලින් වෙනස් වනු ඇත.

ඇස්තමේන්තු සහ ඒ සඳහා පාදක වූ උපකල්පනයන්, අඛණ්ඩ පදනමක් මත සමාලෝචනයට ලක්වේ. ගිණුම් ඇස්තමේන්තු සඳහා සිදුකරනු ලබන සංශෝධනයන්, එම සංශෝධනය සිදුකරනු ලබන කාල සීමාව සඳහා පමණක් බලපාන්නේ නම්, එම කාලසීමාව තුළ හඳුනා ගැනේ.

### 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හී සාරාංශය

පහත දැක්වෙන සියළු ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂය හා සංගත වේ.

සමහර සංසන්දනාත්මක තොරතුරු වර්තමාන වර්ෂයේ තොරතුරු හා ගැලපීම පිණිස අවශ්‍ය අවස්ථාවන්හිදී යලි වර්ගීකරණය කර ඇත.

### 3.1 විදේශ මුදල් පරිවර්තනය

සියළු විදේශීය හුවමාරු ගණුදෙනු එම ගණුදෙනු සිදුවන දිනයේ පැවැති විනිමය අනුපාත අනුව මෙහෙයුම් මුදල් ඒකකයට පරිවර්තනය කරනු ලැබේ.

### 3.2 වත්කම් හා වත්කම් අගය කිරීමේ පදනම

වත්කම් වර්ගීකරණයේදී ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස දක්වනුයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය හෝ වාර්තා කරන දින සිට අවුරුද්දක් තුළ මුදල් කිරීම අපේක්ෂා කළ හැකි මුදල් හා බැංකු ශේෂයන්ය.

### 3.2.1 දේපළ පිරියත හා උපකරණ

#### 3.2.1.1 මූලික හඳුනාගැනීම

දේපළ, පිරියත හා උපකරණ අයිතම පිරිවැයෙන් සම්මුචිත ක්ෂය අඩුකළ අගයට මනිනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට වත්කම් අත්පත් කරගැනීමට හෝ ඉදිකිරීමට සෘජුවම දරණ ලද අවස්ථානුකූල පිරිවැයන් සමඟ මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය, යම් වත්කමක් එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්වයට ගෙන ඒමට හා එම වත්කම් පිහිටුවීමට, වැඩබිමේ යලි ප්‍රතිෂ්ඨාපනයට හා ගලවා ඉවත් කිරීමේ පිරිවැය ඇතුලත් වේ. අදාල උපකරණයේ ක්‍රියාකාරීත්වයට මූලික වන මිලදී ගත් මෘදුකාංගයන්ද එම උපකරණයේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කෙරේ. යම් දේපළ, පිරියත හා උපකරණ කොටස් සඳහා විවිධ ඵලදායී ජීව කාලයක් පවතින විටදී ඒවා වෙනම දේපළ, පරියත හා උපකරණ අයිතම ලෙස ගිණුම් ගත කරයි.

ජාතික පර්යේෂණ සභාවේ ප්‍රදාන මඟින් මිලදී ගන්නා දේපළ, පිරියත හා උපකරණ වත්කම් පවරාදෙන තෙක් හෝ ඉවත් කරන තෙක් ජාතික පර්යේෂණ සභාවේ දේපළ, පිරියත හා උපකරණවල කොටසක් ලෙස තාවකාලිකව හඳුනා ගැනේ.

